(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 4(6).]

# පාර්ලිමේන්තුවේ අංක 4 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2026 සැප්තැම්බර් 11 සිකුරාදා**

**2026 සැප්තැම්බර් 22 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විදේශ විනිමය පනත යටතේ රෙගුලාසි (අංක 1),— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 ජූනි 18 දිනැති අංක 2493/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.09.11 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විදේශ විනිමය පනත යටතේ රෙගුලාසි (අංක 2),— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 ජූනි 18 දිනැති අංක 2493/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.09.11 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විදේශ විනිමය පනත යටතේ නියෝගය,— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 ජූනි 18 දිනැති අංක 2493/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.09.11 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා සහ බලශක්ති අමාත්‍යතුමා,— ඛනිජතෙල් සම්පත් පනත යටතේ නියෝග,— 2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනතේ 17 වගන්තිය සමඟ කියවිය යුතු 48 වගන්තිය යටතේ බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව සහ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදුව, 2026 ජූලි 16 දිනැති අංක 2497/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.09.08 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 සැප්තැම්බර් 23 බදාදා)**

2329/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 9 වගන්තියට අදාළව සංශෝධනයක් ගෙන ඒම සඳහා නිර්දේශ ලබා ගැනීම පිණිස කමිටුවක් පත්කර තිබේද;

(ii) එසේ නම්, එම කමිටුවේ සාමාජිකයන් කවුරුන්ද;

(iii) එම කමිටුව පත්කරන ලද දිනය සහ කමිටුවේ නිර්දේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම වගන්තියට අදාළ සංශෝධන අනුමැතිය සඳහා කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා වන කාලරාමුව කවරේද;

(iii) මෙම වගන්තිය සංශෝධනය නොකිරීමට තීරණය කර තිබේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2330/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ මේ වනවිට සිටින පාරම්පරික වෛද්‍යවරුන් සහ ලියාපදිංචි ආයුර්වේද උපාධිධාරී වෛද්‍යවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) උපාධිධාරී ආයුර්වේද වෛද්‍යවරයෙකු සහ පාරම්පරික වෛද්‍යවරයෙකු පුහුණු කිරීම සඳහා රජය විසින් දරනු ලබන වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වෛද්‍ය කාණ්ඩ දෙක ශ්‍රී ලංකාවේ වෛද්‍ය ක්ෂේත්‍රයට දක්වන දායකත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයේ තීන්දු සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී පාරම්පරික වෛද්‍යවරුන් සඳහා අඩු නියෝජනයක් ලබාදී තිබීමට හේතු කවරේද;

(ii) පවතින නියෝජන ක්‍රමවේදය වෙනස් කිරීම සඳහා පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2331/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආයුර්වේද, සිද්ධ සහ යුනානි වෛද්‍ය ක්‍රම ප්‍රභවය වන රටවල් කවරේද;

(ii) එම වෛද්‍ය ක්‍රම 'දේශීය වෛද්‍ය ක්‍රම' ලෙස සලකනු ලබන පදනම කවරේද;

(iii) ශ්‍රී ලංකාවට ආවේණිකවූ දේශීය පාරම්පරික වෛද්‍ය ශාස්ත්‍රයක් පවතින බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දේශීය පාරම්පරික වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම සඳහා වන නීති කෙටුම්පත සැකසීමේ ක්‍රියාවලිය තුළ පාරම්පරික වෛද්‍යවරුන්ට ප්‍රමාණවත් අවස්ථාවක් ලබාදී තිබේද;

(ii) නොඑසේ නම්, ඒ මන්ද;

(iii) දේශීය පාරම්පරික වෛද්‍ය ක්‍රමය සම්බන්ධ දැනුම ආයතනික ක්‍රමවේදයක් ඔස්සේ ලබා දීමේ හැකියාවක් තිබේද;

(iv) එසේ නම්, විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුළින් එම පාරම්පරික දැනුම සම්පූර්ණයෙන්ම ලබා ගත හැකි වන්නේද;

(v) නොඑසේ නම්, ඒ සඳහා පවතින විකල්පය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 සැප්තැම්බර් 24 බ්‍රහස්පතින්දා)**

2357/2026

ගරු සුරංග රත්නායක මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2026 අප්‍රේල් මාසයේදී 'අස්වැසුම' දත්ත පද්ධතියේ මතුවූ තාක්ෂණික දෝෂයක් හේතුවෙන් සිදුවූ ද්විත්ව ගෙවීම් යටතේ ගෙවා ඇති මුදල සහ එලෙස ගෙවීම් ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් මේ වනවිට අයකරගෙන ඇති මුදල කොපමණද;

(iii) ඉතිරි මුදල අයකර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම තාක්ෂණික දෝෂය සඳහා වගකිව යුතු පාර්ශ්ව හඳුනාගැනීම සඳහා විමර්ශනයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එහි නිගමන කවරේද;

(iii) අස්වැසුම දත්ත පද්ධතිය සහ ගෙවීම් පද්ධතිය පිළිබඳ ස්වාධීන තොරතුරු තාක්ෂණ විගණනයක් සිදු කිරීමට කටයුතු කර තිබේද;

(iv) එසේ නම්, එම විගණනය සිදු කරන ලද දිනය සහ ආයතනය කවරේද;

(v) ඒ සඳහා වැය කර ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2358/2026

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2026 ජුලි 31 දින වනවිට 'අස්වැසුම' සුබසාධක ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අයදුම්කරුවන්ගේ තොරතුරු යාවත්කාලීන කිරීම සම්පූර්ණ කළ පවුල් සංඛ්‍යාව සහ එය සම්පූර්ණ නොකිරීම හේතුවෙන් ප්‍රතිලාභ අහිමිවූ පවුල් සංඛ්‍යාව දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) දෙවන අදියරේ සුදුසුකම්ලාභී නාම ලේඛන සම්බන්ධයෙන් ලැබී ඇති අභියාචනා හා විරෝධතා සංඛ්‍යාව, ඉන් විභාග කර අවසන් කර ඇති සංඛ්‍යාව සහ මුල් තීරණය සංශෝධනයවූ අවස්ථා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) දෝෂ සහිත දත්ත හේතුවෙන් සුදුසුකම් නොලබන පවුල් ප්‍රතිලාභ ලබා ඇති සහ සුදුසුකම් සහිත පවුල් සඳහා ප්‍රතිලාභ අහිමිවූ බවට හඳුනාගෙන ඇති අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(v) සුදුසුකම් නොලැබූ පවුල් සඳහා ප්‍රතිලාභ ලබාදීම හේතුවෙන් සිදුවී ඇති රාජ්‍ය මූල්‍ය පාඩුව කොපමණද;

(vi) වත්මන් නිර්ණායක සංශෝධනය කර නව නිර්ණායක යටතේ ප්‍රතිලාභීන් තෝරා ගැනීම සම්බන්ධයෙන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව ලබා දුන් උපදෙස් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2359/2026

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2025 වර්ෂයේ සිට 2029 වර්ෂය දක්වා කාලය තුළ අඩු ආදායම්ලාභී පවුල් සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ සවිබල ගැන්වීමට අපේක්ෂිත පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පවුල් අතරින් අස්වැසුම ප්‍රතිලාභී සහ අස්වැසුම නොලබන සමෘද්ධි පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අස්වැසුම යෝජනා ක්‍රමයේ සංක්‍රාන්තික සහ අවදානමට ලක්වූ කාණ්ඩවල පවුල් අතරින් ගෙවීම් අත්හිටුවා ඇති පවුල් සංඛ්‍යාව 2025 සහ 2026 වර්ෂ අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2026 අගෝස්තු 01 දින වනවිට එම වැඩසටහන යටතේ ලියාපදිංචි කර ඇති පවුල් සංඛ්‍යාව දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පවුල් අතරින් ජීවනෝපාය ප්‍රදාන, ව්‍යාපාර ප්‍රාග්ධනය, වෘත්තීය පුහුණුව හෝ රැකියා ලබාදී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) 2025 වර්ෂය සඳහාවූ ඉලක්කයට සාපේක්ෂව සවිබල ගැන්වීම සම්පූර්ණ කළ පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) 2026 වර්ෂය තුළ අස්වැසුම ප්‍රතිලාභී පවුල් ඵලදායි ආර්ථික කටයුතුවලට යොමු කිරීමේ ඉලක්කයට සාපේක්ෂව වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 සැප්තැම්බර් 25 සිකුරාදා)**

2378/2026

ගරු නිතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'Mission Olympics 2028 - Journey to the Rings' වැඩසටහන යටතේ මේ වනවිට ගිවිසුම්ගත කර ඇති ක්‍රීඩක ක්‍රීඩිකාවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව එක් එක් ක්‍රීඩාව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ක්‍රීඩක ක්‍රීඩිකාවන් තෝරා ගැනීමේදී අනුගමනය කරන ලද නිර්ණායක සහ තේරීම් කමිටු සංයුතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2025 සහ 2026 වර්ෂ සඳහා —

(i) මෙම වැඩසටහනට වෙන් කරන ලද ප්‍රතිපාදන සහ තථ්‍ය වියදම;

(ii) එක් ක්‍රීඩකයෙකු සඳහා දරන ලද සාමාන්‍ය වාර්ෂික පිරිවැය;

(iii) විදේශීය පුහුණුව සහ පුහුණුකරුවන් සඳහා දරන ලද වියදම;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) 2028 වර්ෂයේ ලොස් ඇන්ජලීස් ඔලිම්පික් උළෙල දක්වා අවශ්‍ය මුළු ඇස්තමේන්තුගත මුදල කොපමණද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2379/2026

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'ක්‍රීඩා සංස්කෘතියක් ගොඩනැගීම', 'ග්‍රාමීය පාසල් හා යෞවන සමාජ සඳහා ක්‍රීඩා යටිතල පහසුකම්' සහ 'හඳුනාගත් ක්‍රීඩා පාසල් සංවර්ධනය' යන ව්‍යාපෘති 03හි ඇස්තමේන්තුගත මුළු පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එක් එක් ව්‍යාපෘතිය යටතේ 2025 සහ 2026 වර්ෂවල වැඩ ආරම්භ කරන ලද ස්ථාන සංඛ්‍යාව දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙම ව්‍යාපෘති සඳහා ග්‍රාමීය පාසල් සහ යෞවන සමාජ තෝරා ගැනීමේ නිර්ණායක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එක් එක් ව්‍යාපෘතිය සඳහා 2025 සහ 2026 වර්ෂවල වෙන් කළ ප්‍රතිපාදන සහ තථ්‍ය වියදම කොපමණද;

(ii) එම වර්ෂ සඳහා වෙන් කළ මුළු ප්‍රතිපාදනය භාවිතා කර තිබේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iv) කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීමට ඇති හිඟ බිල්පත්වල වටිනාකම කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2380/2026

ගරු හර්ෂණ රාජකරුණා මහතා,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යෞවන සමාජවල නිලධාරින් තෝරා ගැනීමේදී අනුගමනය කරන ක්‍රියාපටිපාටිය කවරේද;

(ii) 2025 හා 2026 වර්ෂවලදී විසුරුවා හරින ලද හෝ ප්‍රතිසංවිධානය කරන ලද යෞවන සමාජ සංඛ්‍යාව දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලාංකීය තාරුණ්‍යයේ අනාගත අභිවෘද්ධිය සඳහා ඒකාබද්ධ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශ 04ක සහභාගිත්වයෙන් ක්‍රියාත්මක වන ඒකාබද්ධ තරුණ වැඩසටහන සඳහා පත් කරන ලද අමාත්‍ය කමිටුවේ සාමාජිකයන් කවරේද;

(ii) එම කමිටුව රැස්වූ වාර ගණන කවරේද;

(iii) එම කමිටුව විසින් මේ දක්වා අත්කරගෙන ඇති ප්‍රතිඵල සහ එමඟින් ප්‍රතිලාභ ලැබූ තරුණ තරුණියන් සංඛ්‍යාව කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 ඔක්තෝබර් 06 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

371/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ගවල ප්‍රගතිය කවරේද;

(ii) මේ වනවිට ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු මුළු සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීම සඳහා කටයුතු කර ඇති ප්‍රදේශ කවරේද;

(iv) ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීම ශ්‍රී ලංකාව පුරා ක්‍රියාත්මක කිරීම සඳහා පවතින බාධා කවරේද;

(v) 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යාවත්කාලීන කර සංශෝධනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

705/2025

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) යුනයිටඩ් පෙට්‍රෝලියම් ලංකා (United Petroleum Lanka) සමාගම සිය මෙහෙයුම් ශ්‍රී ලංකාව තුළ ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම සමාගම ශ්‍රී ලංකාවේ කරන ලද මුළු ආයෝජනයේ වටිනාකම කොපමණද;

(iii) ඉහත සමාගම සමඟ එළැඹ ඇති ගිවිසුම්වල සඳහන් කොන්දේසි කවරේද;

(iv) මෙහෙයුම් කටයුතු සඳහා එම සමාගමට ලබා දුන් ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව කොපමණද;

(v) ඉහත සමාගම ශ්‍රී ලංකාවේ සිය මෙහෙයුම් කටයුතු නැවැත්වීමට හේතුවූ කරුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

769/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු නැගෙනහිර ප්‍රදේශවල සන්නද්ධ ගැටුම් පැවති කාලසීමාවේදී ක්‍රියාකාරීව පැවති අතුරු සන්නද්ධ කණ්ඩායම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම කණ්ඩායම්වල නම්, භාවිතා කරනු ලැබූ ආයුධ වර්ග සහ ආයුධ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම කණ්ඩායම් සන්තකයේ තිබී ආරක්ෂක හමුදා භාරයට ගන්නා ලද ආයුධ සංඛ්‍යාව සහ නීත්‍යානුකූලව භාරදුන් ආයුධ සංඛ්‍යාව එක් එක් කණ්ඩායම අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මේ වනවිට එවැනි අතුරු සන්නද්ධ කණ්ඩායම් ක්‍රියාත්මකව පවතින්නේද;

(v) එම කණ්ඩායම් සම්බන්ධයෙන් මේ වනවිට රජය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

985/2025

ගරු කිංස් නෙල්සන් මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් පුහුණු කිරීම මඟින් උපයා ඇති ආදායම කොපමණද;

(ii) එම ආදායම උපයන මාර්ග කවරේද;

(iii) එම කාල සීමාව තුළ කාර්යාංශයේ පුහුණුව ලබා විදේශගතවූ සහ එම පුහුණුව නොලබා විදේශ ගතවූ ශ්‍රමික සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පළමු වතාවට විදේශගත වන සෑම ශ්‍රමිකයෙකුටම කාර්යාංශය මඟින් පුහුණුවක් ලබා දීම අනිවාර්ය කිරීම වැදගත් බැවින්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1668/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිලිනොච්චිය මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයාගේ නම, පදිංචි ලිපිනය සහ ඔහුගේ සේවා කාලය කොපමණද;

(ii) එම නිලධාරියා මීට පෙර මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයෙකු හෝ පොලිස් ස්ථානාධිපතිවරයෙකු ලෙස සේවය කර තිබේද;

(iii) එසේ නම්, එම පොලිස් ස්ථානය කවරේද;

(iv) මූලස්ථාන පොලිස් පරීක්ෂකවරු පත්කිරීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2193/2026

ගරු රුවන් විජේවීර මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන කර්මාන්තපුර සහ කාර්මික ජනපද සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) කර්මාන්තපුර හා කාර්මික ජනපද පිහිටුවීමේ අරමුණු කවරේද;

(iii) කර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා රජය විසින් ඉදිරියේදී පිහිටුවීමට අපේක්ෂිත කර්මාන්තපුර සහ කාර්මික ජනපද තිබේද;

(iv) එසේ නම්, ඒවා කවරේද;

(v) කර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා අමාත්‍යාංශය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2265/2026

ගරු මංජුල සුරවීර ආරච්චි මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නුවරඑළිය දිස්ත්‍රික්කයේ උපත ලබන දරුවන් සම්බන්ධ සියලුම තොරතුරු රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට වාර්තා වන්නේද;

(ii) එම දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිත ප්‍රජාව අතරින් උපත ලබා මාස 03ක් ඇතුළත උප්පැන්න ලියාපදිංචි කර නොමැති දරුවන් සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම දරුවන්ගේ උප්පැන්න සහතික ලබා නොගැනීමට බලපා ඇති හේතු සහ ඒ හේතුවෙන් එම දරුවන්ට ඉදිරියේදී මුහුණ දීමට සිදුවන ගැටලු හඳුනාගෙන තිබේද;

(iv) මෙම ප්‍රජාව මුහුණ දෙන ගැටලු විසඳා කඩිනමින් උප්පැන්න සහතික ලබා දීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් සැලසුම් කර තිබේද;

(v) එසේ නම්, එම වැඩපිළිවෙළ එක් එක් කොට්ඨාසය අනුව ක්‍රියාත්මක කරන ආකාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2276/2026

ගරු ධනුෂ්ක රංගනාත් මහතා,— ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වැඩිහිටි පුරවැසියෙක් ලෙස සලකනු ලබන වයස් සීමාව කවරේද;

(ii) වර්තමානය වනවිට මෙරට වැඩිහිටි පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iii) වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය පිහිටුවන ලද දිනය කවරේද;

(iv) එම ආයතනය පිහිටුවීමේ අරමුණ කවරේද;

(v) ආයතනය මඟින් ඉටුකරනු ලබන සේවාවන් කවරේද;

(vi) එම සේවාවන් ලබා ගන්නා වැඩිහිටි පුද්ගලයන් සංඛ්‍යාව සේවාව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2289/2026

ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා ව්‍යවස්ථාව අනුව පළමු ශ්‍රේණියට උසස් වීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා වර්ෂ 12ක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරින්ගෙන් ඒ සඳහා අයදුම්පත් කැඳවිය යුතු බව දන්නේද;

(ii) 2013 වර්ෂයේ එම සේවයට බඳවාගත් නිලධාරින්ගෙන්, පළමු ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවා තිබේද;

(iii) නොඑසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

(iv) එම නිලධාරින් පළමු ශ්‍රේණියට උසස් කිරීම සඳහා නියමිත කාලයේදී අයදුම්පත් නොකැඳවීමෙන් ඔවුන්ට අසාධාරණයක් සිදුවී ඇති බව පිළිගන්නේද;

(v) එම නිලධාරින් පළමු ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවීම කඩිනම් කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2292/2026

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මගීන් ප්‍රවාහනය සඳහා යොදවා ඇති පෞද්ගලික බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම පෞද්ගලික බස් රථ නියාමනය කරනු ලබන ආයතනය කවරේද;

(iii) පෞද්ගලික බස් රථයක් මගී ප්‍රවාහනය සඳහා යෙදවීමේදී වාර්ෂිකව, මාසිකව හෝ දෛනිකව රජයට ගෙවිය යුතු බදු, බලපත්‍ර ගාස්තු සහ වෙනත් ගෙවීම් කවරේද;

(iv) එම ගෙවීම් සිදු කිරීමේදී මුදල් ලැබුණු බවට බස් රථ හිමියන් වෙත ලදුපත් නිකුත් කරන්නේද;

(v) එසේ නම්, එම ආයතනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දිවයිනේ බොහෝ පළාත්වල පිහිටි ප්‍රසිද්ධ බස් නැවතුම්පොළවල නතර කරනු ලබන බස් රථවලින් මුදල් අයකරනු ලබන පුද්ගලයන් සිටින බව දන්නේද;

(ii) එම පුද්ගලයන්ට බස් රථවලින් එලෙස මුදල් අයකර ගැනීම සඳහා නීතිමය බලයක් හෝ අවසරයක් තිබේද;

(iii) නොඑසේ නම්, එය වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 ඔක්තෝබර් 06 අඟහරුවාදා)**

2389/2026

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2026 වර්ෂය සඳහා විදේශ රැකියා සඳහා යොමු කිරීමට ඉලක්කගත සංඛ්‍යාව කොපමණද;

(ii) 2026.01.01 දින සිට 2026.06.30 දිනට විදේශ රැකියා සඳහා යොමු කළ සංඛ්‍යාව කොපමණද;

(iii) ඉලක්කගත සංඛ්‍යාව සපුරා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට තානාපතිවරයෙකු නොමැති ශ්‍රී ලංකා දූත මණ්ඩල සහ පුරප්පාඩුවී පවතින කාලසීමාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) දූත මණ්ඩල ප්‍රධානීන් අතරින් ශ්‍රී ලංකා විදේශ සේවයට අයත් සහ බාහිරව පත් කර ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2025.01.01 දින සිට මේ දක්වා අමාත්‍යාංශය විසින් විදේශ සංචාර සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(ii) සංචාරය කරන ලද රටවල්, දිනයන්, සංචාරයට සම්බන්ධවූ සංඛ්‍යාව සහ සංචාරවල අරමුණු කවරේද;

(iii) එම එක් එක් සංචාරය සඳහා ගුවන් ගමන්, නවාතැන් සහ දීමනා ඇතුළු මුළු වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) අත්සන් කළ ගිවිසුම්, අවබෝධතා ගිවිසුම් සහ ලබාගත් ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2404/2026

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මධ්‍යම පළාත් සභාවේ ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් වාර්ෂිකව පළාත් ක්‍රීඩා තරඟාවලියක් පවත්වනු ලබන බවත්;

(ii) එම තරඟාවලියට අදාළව ජයග්‍රාහකයන් සඳහා වර්ෂයට අදාළව ක්‍රීඩා වර්ණ ප්‍රදානෝත්සවයක් පවත්වනු ලබන බවත්;

(iii) එය එළඹෙන වර්ෂයේ පළාත් ක්‍රීඩා තරඟයේ අවසන් දිනට පෙර පවත්වා වර්ණ ප්‍රදානය කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2025 වර්ෂයේ මධ්‍යම පළාත් ක්‍රීඩා වර්ණ ප්‍රදානෝත්සවය සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(ii) එසේ නම්, වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(iii) ප්‍රතිපාදන වෙන් කිරීමෙන් පසුව වර්ණ ප්‍රදානෝත්සවය පැවැත්වීමට නියම කරනු ලැබූ දිනය කල් තබා තිබේද;

(iv) එසේ නම්, කල් දමන ලද වාර ගණන කොපමණද;

(v) වර්ණ ප්‍රදානෝත්සවය මේ වනවිට පවත්වා අවසන් කර තිබේද;

(vi) නොඑසේ නම්, පැවැත්වීමට නියමිත දිනය කවරේද;

(vii) එම උත්සවය නොපවත්වන්නේ නම්, ඒ සඳහා වෙන් කළ ප්‍රතිපාදනවල වර්තමාන තත්ත්වය කවරේද;

(viii) 2026 වර්ෂයට අදාළ මධ්‍යම පළාත් ක්‍රීඩා අවසන් මහා තරඟය සඳහා දින නියම කර තිබේද;

(ix) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2406/2026

ගරු මුජිබුර් රහුමාන් මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) එක්සත් ජනපදය විසින් මෑතකදී ශ්‍රී ලංකාවට ලබා දුන් 'TH-57 සී රේන්ජර්' හෙලිකොප්ටර් යානා —

(i) ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය ඉල්ලීමක් කළ දිනය සහ එක්සත් ජනපදයේ අනුමැතිය ලැබුණු දිනය කවරේද;

(ii) ලබා ගැනීමේ ගිවිසුම අත්සන් කළ දිනය, එහි පාර්ශ්වකරුවන් සහ ලැබුණු ආකාරය (පරිත්‍යාගයක්ද, ණයක්ද, විකුණුමක්ද) කවරේද;

(iii) ඇස්තමේන්තුගත වෙළඳපොළ වටිනාකම එක්සත් ජනපද ඩොලර්වලින් කොපමණද;

(iv) අතිරික්ත ආරක්ෂක උපකරණ (EDA) ලේඛනවල දැක්වෙන මුල් මිලදී ගැනීමේ වටිනාකම සහ වත්මන් වටිනාකම කවරේද;

(v) යෙදවීමට අපේක්ෂිත ප්‍රධාන කාර්යයන් කවරේද;

(vi) මෙරටට ගෙන්වා ගැනීම දක්වා ශ්‍රී ලංකා රජය දැරූ මුළු වියදම කොපමණද;

(vii) ලැබීමෙන් පසු අලුත්වැඩියා කිරීම, යළි ගුවන්ගත කිරීම සහ සහතික කිරීම සඳහා වැය කළ මුදල කොපමණද;

(viii) මේ දක්වා ගුවන්ගතවී ඇති මුළු පියාසර පැය ගණන සහ ඉතිරි පියාසර පැය ගණන එක් එක් යානයේ ලියාපදිංචි අංකය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2026 ඔක්තෝබර් 07 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

475/ 2025

ගරු රවී කරුණානායක මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා සතොස සමාගම 2020 සිට 2025 දක්වා වර්ෂවලදී වාර්තා කරන ලද ලාභය හෝ අලාභය, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට ක්‍රියාත්මක වන එකී ආයතනයේ අලෙවිසැල් සංඛ්‍යාව කොපමණද;

(iii) අද දින වනවිට එම ආයතනයේ සේවයේ නියුතු සේවක සංඛ්‍යාව කොපමණද;

(iv) වැටුප් සහ දීමනා වෙනුවෙන් දරන ලද මුළු වියදම කොපමණද;

(v) ඉහත (i)හි සඳහන් එක් එක් වර්ෂය තුළ ගෙවන ලද ඍජු සහ වක්‍ර බදු ප්‍රමාණය, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එකී ආයතනයේ ප්‍රාග්ධන පදනම කවරේද;

(vii) එකී ආයතනයේ මෙහෙයුම් කටයුතු සඳහා 2020 සිට 2025 දක්වා ලබාගෙන ඇති ණය ප්‍රාග්ධනය, එක් එක් වර්ෂය සඳහා වෙන් වෙන් වශයෙන් කොපමණද;

(viii) 2020 සිට 2025 දක්වා එක් එක් වර්ෂය සඳහා එකී ආයතනයේ වාර්ෂික පිරිවැටුම සහ විකුණුම් පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

904/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වාලච්චේන රජයේ රෝහල දීර්ඝ කාලයක සිට සංවර්ධනය කර නොමැති බවත්;

(ii) ඒ හේතුවෙන් එම රෝහලට පැමිණෙන රෝගීන් විශාල ලෙස අපහසුතාවයන්ට පත්වන බවත්;

එතුමා දන්නෙහිද;

(ආ) (i) එම රෝහල සියලු පහසුකම් සහිත රෝහලක් බවට පත් කිරීම සඳහා වැඩපිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1833/2026

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හල්මුල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හල්මුල්ල පාර, පළමු පටුමග දෙපස කැලණි ගං ඉවුර සේදීයාම හේතුවෙන් අනතුරුදායක තත්ත්වයක් පවතින බව දන්නේද;

(ii) එසේ නම්, ඒ හේතුවෙන් අනතුරට ලක්විය හැකි නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇති පියවර කවරේද;

(iv) එම ස්ථාන වලින් පදිංචිකරුවන් ඉවත් කිරීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එම පුද්ගලයන්ට වන්දි ලබාදීමට හෝ නිවාස ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) නොඑසේ නම්, පදිංචිකරුවන් එම ස්ථානයේම රඳවා තබා ගැනීම සඳහා අනුගමනය කරනු ලබන ආරක්ෂිත ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1917/2026

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා කාලසීමාව තුළ අනුරාධපුර දිස්ත්‍රික්කයේ රඹෑව, මැදවච්චිය, කැබිතිගොල්ලෑව සහ පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ක්‍රියාත්මක කළ නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ව්‍යාපෘති පිහිටි ස්ථාන කවරේද;

(iii) එම එක් එක් ව්‍යාපෘතිය යටතේ ඉදිකළ නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) නිවාස ව්‍යාපෘති ආධාර හෝ ණය පදනම මත ක්‍රියාත්මක කර තිබේද;

(v) එම නිවාස ඉදිකළ ඉඩම් නිරවුල්ව හඳුනාගෙන තිබේද;

(vi) නොඑසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

(vii) මේ වනවිට පුද්ගලයන් පදිංචි නිවාස සංඛ්‍යාව ව්‍යාපෘතිය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2297/2026

ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දකුණු පළාතේ ගංවතුර පාලනය, වාරි කෘෂිකර්මාන්තය දියුණු කිරීම, පානීය ජල හා කර්මාන්ත ජල අවශ්‍යතා සපුරාලීම ඇතුළු අරමුණු රැසක් මුල්කර ගනිමින් දීර්ඝ කාලයකට පෙර යෝජනා කරන ලද 'ඉහළ ගිං-නිල්වලා ජල හරවා යැවීමේ ව්‍යාපෘතිය' තවදුරටත් රජයේ සංවර්ධන සැලසුම් අතර පවතින්නේද;

(ii) එම ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය කවරේද;

(iii) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයන, පාරිසරික බලපෑම් ඇගයීම්, ඉංජිනේරු සැලසුම් සහ අනෙකුත් මූලික අධ්‍යයන කටයුතු අවසන් කර තිබේද;

(iv) එසේ නම්, එම අධ්‍යයනවල ප්‍රධාන නිර්දේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අනුමැතීන් ලබාගෙන තිබේද;

(ii) නොඑසේ නම්, තවදුරටත් ලබාගත යුතු අනුමැතීන් කවරේද;

(iii) එම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මේ දක්වා සැලසුම්කරණය, අධ්‍යයන සහ අනෙකුත් මූලික කටයුතු සඳහා රජය විසින් දරා ඇති මුළු වියදම කොපමණද;

(iv) රජය විසින් එම ව්‍යාපෘතිය නැවත සක්‍රිය කර ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන්නේද;

(v) නොඑසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 ඔක්තෝබර් 07 බදාදා)**

2407/2026

ගරු මුජිබුර් රහුමාන් මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුහුදේ සිදු කරනු ලබන සෙවීම් සහ ගලවා ගැනීමේ මෙහෙයුම් සඳහා නාවික හමුදාව සහ ගුවන් හමුදාව අතර පවතින වර්තමාන ක්‍රියාපටිපාටිය කවරේද;

(ii) 2025 සහ 2026 වර්ෂවලදී මුහුදේ සිදු කළ සෙවීම් සහ ගලවා ගැනීමේ මෙහෙයුම් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉන් ගුවන් සහාය ලබා දුන් මෙහෙයුම් සංඛ්‍යාව කොපමණද;

(iv) එම මෙහෙයුම් සඳහා සාමාන්‍ය ප්‍රතිචාර කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 'දිට්වා' සුළිකුණාටුව සමයේ මුහුදු හා ගංගා ආශ්‍රිත ගලවා ගැනීම් සඳහා ගුවන් යානා යෙදවීමේදී හඳුනාගත් අඩුපාඩු සහ ඒවා නිවැරදි කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(ii) 2026 ජුනි මාසයේදී එක්සත් ජනපදයෙන් නාවික හමුදාවට ලැබුණු වෙරළාරක්ෂක නෞකාවට හෙලිකොප්ටර් මෙහෙයුම් සිදු කිරීමේ හැකියාව තිබේද;

(iii) එසේ නම්, එය මේ වනවිට භාවිත කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2408/2026

ගරු මුජිබුර් රහුමාන් මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා නාවික හමුදාව සතුව හෙලිකොප්ටර් ගොඩබෑමේ පහසුකම් සහිත ගැඹුරු මුහුදේ යාත්‍රා කළ හැකි නෞකා තිබේද;

(ii) එසේ නම්, එම නෞකාවල හෙලිකොප්ටර් ගොඩබා සුරක්ෂිත කිරීමේ (deck-lock/harpoon) පද්ධති තිබේද;

(iii) නාවික හමුදාව සතුව 'නාවික ගුවන් අංශයක්' තිබේද;

(iv) නොඑසේ නම්, එවැනි අංශයක් පිහිටුවීම සඳහා යෝජනාවක්, සංකල්ප පත්‍රිකාවක් හෝ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් සකස් කර තිබේද;

(v) එසේ නම්, එය ඉදිරිපත් කළ දිනය සහ වර්තමාන තත්ත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නාවික හමුදාව සඳහා ගුවන් නියමුවන් බඳවාගෙන තිබේද;

(ii) එසේ නම්, බඳවාගත් නිලධාරීන් සංඛ්‍යාව, බඳවාගැනීම සිදු කළ වර්ෂය, අනුමත තනතුරු නාමය, පුහුණුව ලබා දුන් හෝ ලබා දීමට නියමිත ආයතනය සහ අනුමැතිය ලබා දුන් බලධාරීන් කවුරුන්ද;

(iii) එලෙස බඳවාගත් නිලධාරීන් වර්තමානයේ ඉටු කරනු ලබන රාජකාරි කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 ඔක්තෝබර් 08 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

787/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මීගමුව ඩිපෝව සතුව මේ වනවිට ධාවනයට සුදුසු මට්ටමේ පවතින බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට එම ඩිපෝව මඟින් දෛනිකව ධාවනය කරනු ලබන බස් රථ සංඛ්‍යාව කොපමණද;

(iii) එම ඩිපෝවේ පවතින සේවක පුරප්පාඩු කවරේද;

(iv) එම ඩිපෝව 2015 වර්ෂයේ සිට මේ දක්වා වාර්ෂිකව ලැබූ ලාභ/අලාභ කවරේද;

(v) මීගමුව නගරයේ සිට දුරගමන් සේවා ආරම්භ කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

911/2025

ගරු මුජිබුර් රහුමාන් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, රේගු පරිගණක පද්ධතිය සමඟ සම්බන්ධවීමට ප්‍රථම අනීතික වාහන ලියාපදිංචි කිරීම සම්බන්ධව විගණකාධිපතිවරයා ඉදිරිපත් කළ කරුණු කවරේද;

(ii) ඒ අනුව, එම අක්‍රමිකතාවලට දායකවී ඇති නිලධාරීන්ගේ නම් සහ තනතුරු නාම කවරේද;

(iii) එම සිදුවීම තුළින් රජයට අහිමිවී ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එම සිදුවීම සම්බන්ධව අමාත්‍යාංශ මට්ටමින් ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1040/2025

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවීමට හිඟව ඇති පෞද්ගලික ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතනවල නම් කවරේද;

(iii) එම ගෙවීමට ඇති හිඟ මුදල් ප්‍රමාණය ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම හිඟ මුදල් අයකර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1078/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනයේ සහ උතුරු පළාතේ අනෙකුත් දිස්ත්‍රික්කවල ඇති පාරිසරික, ඓතිහාසික සහ සංස්කෘතික ආකර්ෂණයන් හඳුනාගෙන ඒවා ප්‍රවර්ධනය කිරීමට ගනු ලබන පියවර කවරේද;

(ii) දේශීය සංස්කෘතිය, ප්‍රජාවන් සහ පරිසර පද්ධතීන් ආරක්ෂා කර ගනිමින් මෙම ප්‍රදේශය සංචාරක උපාය මාර්ගයට ඒකාබද්ධ කිරීම සඳහා කලාපීය වශයෙන් විශේෂිත සැලසුම් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දේශීය පාරිසරික සංචාරක ස්ථාන වෙත ප්‍රවේශය වැඩිදියුණු කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(ii) නවාතැන් සහ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා අමාත්‍යාංශය, අදාළ පාර්ශ්වකරුවන් සමඟ හවුල්කාරිත්වයෙන් කටයුතු කර තිබේද;

(iii) දේශීය ප්‍රජාවන්, විශේෂයෙන්ම තරුණ තරුණියන් සහ කාන්තාවන් පුහුණු කිරීම සහ සේවයේ යෙදවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(iv) උතුරු පළාතේ ගැටුම්වලින් බලපෑමට ලක්වූ දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කිරීම සඳහා පාරිසරික ආරක්ෂණ විධිවිධාන ඇතුළත් පුළුල් පරිසර සංචාරක ප්‍රතිපත්තියක් පිළිබඳව සලකා බලනු ලබන්නේද;

(v) යාපනය ගෝලීය සහ දේශීය වශයෙන් ප්‍රචලිත කිරීම සඳහා සහ පරිසරයට සහ දේශීය ජීවනෝපායන්ට සංචාරක ව්‍යාපාරයේ දිගු කාලීන බලපෑම් නිරීක්ෂණය කිරීම සඳහා වන යාන්ත්‍රණයන් කවරේද?

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1338/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි කඩොලාන වනාන්තර සංඛ්‍යාව කොපමණද;

(ii) එම කඩොලාන වනාන්තරවල නම් කවරේද;

(iii) එම කඩොලාන වනාන්තර අතරින් මේ වනවිට රක්ෂිත බවට පත් කර ඇති වනාන්තර සංඛ්‍යාව කොපමණද;

(iv) එම වනාන්තරවල නම් කවරේද;

(v) විවිධ ක්‍රියාකාරකම් හේතුවෙන් විනාශ වීමේ තර්ජනයට ලක්ව ඇති කඩොලාන වනාන්තර සංඛ්‍යාව කොපමණද;

(vi) එලෙස තර්ජනයට ලක්ව ඇති කඩොලාන වනාන්තරවල නම් කවරේද;

(vii) කඩොලාන පරිසර පද්ධතිය අනාගත පරම්පරාව උදෙසා ආරක්ෂා කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1380/2025

ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ක්‍රියාත්මක රජයේ විශ්වවිද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම විශ්වවිද්‍යාලවල නම් කවරේද;

(iii) විශ්වවිද්‍යාලවල මේ වනවිට ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් විශ්වවිද්‍යාලය මඟින් නේවාසික පහසුකම් සපයා ඇති ශිෂ්‍ය සංඛ්‍යාව, සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) නේවාසික පහසුකම් පිළිබඳ උග්‍ර හිඟයක් පවතින විශ්වවිද්‍යාල කවරේද;

(vi) නේවාසික පහසුකම් පිළිබඳ ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1530/2025

ගරු තුරෙරෙරාසා රවිකරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කොට්ඨාස මට්ටමින් තොරතුරු තාක්ෂණ දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථාන (ITDLH) පිහිටුවීමේ අරමුණු සහ අපේක්ෂිත ප්‍රතිලාභ කවරේද;

(ii) උතුරු සහ නැගෙනහිර පළාත්වල ඇතැම් අධ්‍යාපන කොට්ඨාසවල එම මධ්‍යස්ථාන මෙතෙක් ස්ථාපිත කර නොමැති බව දන්නේද;

(iii) එසේ නම්, මෙතෙක් එම මධ්‍යස්ථාන ස්ථාපිත කර නොමැති කොට්ඨාස කවරේද;

(iv) එම කොට්ඨාසවල මධ්‍යස්ථාන ස්ථාපිත නොකිරීමට හේතු කවරේද;

(v) මෙතෙක් මධ්‍යස්ථාන ස්ථාපිත කර නොමැති සියලුම අධ්‍යාපන කොට්ඨාසවල ඒවා ස්ථාපිත කිරීම සඳහා කාල වකවානු සහිත සැලැස්මක් සකස් කර තිබේ නම්, එය ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

(vi) තාක්ෂණය පදනම් කරගත් දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථාන ස්ථාපිත කර නොමැති කොට්ඨාසවල සමානාත්මතාවය තහවුරු කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1835/2026

ගරු චානක මාදුගොඩ මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්තමාන රජයේ ප්‍රතිපත්තිය අනුව 'අධ්‍යාපන සභාව' පිහිටුවීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, එම ආයතනයේ සංවිධාන ව්‍යුහය කවරේද;

(iii) ගුරු-විදුහල්පති වැටුප් විෂමතා විසඳීම සඳහා වන 'සුබෝධනී වාර්තාව' ක්‍රියාත්මක කිරීමේදී නව ආයතනයක අවශ්‍යතාවය ඇති වන්නේ කවර ආකාරයකින්ද;

(iv) මෙම ආයතනය පිහිටුවා අවසන් කිරීමට නිශ්චිත කාල රාමුවක් තිබේද;

(v) එම ආයතනය මඟින් ගුරුවරුන්ගේ වෘත්තීය තත්ත්වය ඉහළ නැංවීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1951/2026

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ තේ නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතියේ සිදුව ඇතැයි පැවසෙන මූල්‍ය වංචාව සම්බන්ධයෙන්වූ විමර්ශන වාර්තාව අමාත්‍යාංශය විසින් පිළිගෙන තිබේද;

(ii) එම මහජන මුදල අදාළ පුද්ගලයන්ගේ පෞද්ගලික දේපළවලින් අයකර ගැනීම සඳහා ගෙන ඇති හෝ ගැනීමට නියමිත ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම සිද්ධිය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කර තිබේද;

(iv) සිද්ධියට සම්බන්ධ පුද්ගලයන් වෙනත් සමුපකාර සමිතිවල තනතුරු දැරීම වැළැක්වීම සඳහා ගෙන ඇති හෝ ගැනීමට නියමිත ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2280/2026

ගරු එම්. එස්. උදුමාලෙබ්බෙ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, ගල්ඔය ව්‍යාපාරය යටතේ ඇති සේනානායක සමුද්‍රයේ වර්තමානයේ රඳවාගෙන ඇති ජල ප්‍රමාණය අක්කර අඩිවලින් කොපමණද;

(ii) 1992 වර්ෂයේ සිට සේනානායක සමුද්‍රයේ ප්‍රධාන බැම්ම, සොරොව් කුළුණ, සොරොව් බැරලය, ජලය නිකුත් කිරීමේ පද්ධතිය සහ පිටවාන් පද්ධතිය සම්බන්ධ ඉරි තැලීම් ඇතුළු තාක්ෂණික ගැටලු හඳුනාගෙන ඇති අතර, එම තත්ත්වය මේ වනවිට තීව්‍රවී ඇති බැවින් ජලාශයේ තිරසරභාවය සහ දිගු කාලීන ආරක්ෂාව සම්බන්ධයෙන් අවදානම් තත්ත්වයක් මතුවී ඇති බව දන්නේද;

(iii) කෘෂි පවුල් 170,000කට පමණ වාරි පහසුකම් සලසමින් දිස්ත්‍රික්කයේ කෘෂි ආර්ථිකයේ ප්‍රධාන මූලාශ්‍රයක් බවට පත්ව ඇති මෙම ජලාශ පද්ධතියේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා පුළුල් අධ්‍යයනයක් සහ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

---

**2026 ඔක්තෝබර් 09 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1194/2025

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ, ඩෙල්ෆ්ට් දූපතේ ප්‍රධාන ප්‍රවාහන මාධ්‍යය මුහුදු මාර්ගය බව දන්නේද;

(ii) එහි මගී ප්‍රවාහන සේවයේ යොදවා ඇති 'නෙඩුන්තාරගෙහෙ මගී බෝට්ටුවේ' සේවය කරන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සේවකයන් දරන තනතුරු කවරේද;

(iv) එම සේවකයන් පත් කර සිටින පදනම සහ පත් කරන ලද දින වකවානු, තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම සේවකයන්ට කොන්ත්‍රාත් පදනම මත පත්වීම් ලබාදී තිබෙන්නේ කවුරුන් විසින්ද;

(vi) විලියම් යේසුදාසන් ඇන්තනිරාජ් මහතා, සින්දාකුලම් මෙල්කියාස්මිලන් මහතා, ඇල්බට් මරියදාසන් මහතා, ඇන්තනි අමලදාස් මහතා සහ ඇන්රූස් රකීම්ලයෝන් මහතා යන අයගේ අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් සහ සේවා කාලය සැලකිල්ලට ගෙන ඔවුන්ට ස්ථිර පත්වීම් ලබා දීමට කටයුතු කරන්නේද;

(vii) එසේ නම්, ස්ථිර පත්වීම් ලබා දෙන දිනය කවරේද;

(viii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1683/2025

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) කින්නියා මධ්‍ය විද්‍යාලයේ පිහිටි අබ්දුල් මජීඩ් ශාලාව සහ අල්-අක්සා විද්‍යාලයේ පිහිටි එම්.ඊ.එච්. මහරූෆ් ශ්‍රවණාගාරය ඉදිකරනු ලැබූ දිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) කින්නියා මධ්‍ය විද්‍යාලයේ පිහිටි අබ්දුල් මජීඩ් ශාලාව ඉදිකිරීමෙන් පසුව ඉදිකරන ලද අල්-අක්සා විද්‍යාලයේ පිහිටි එම්.ඊ.එච්. මහරූෆ් ශ්‍රවණාගාරය කඩා ඉවත් කර ඇති බව දන්නේද;

(iii) එසේ නම්, එම ගොඩනැගිල්ල කඩා ඉවත් කළ දිනය කවරේද;

(iv) එම ගොඩනැගිල්ල නිසි අනුමැතියක් යටතේ කඩා ඉවත් කර තිබේද;

(v) එසේ නම්, ඒ සඳහා අනුමැතිය දුන් පුද්ගලයින් කවුරුන්ද;

(vi) එම ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම සම්බන්ධයෙන්, අදාළ අධ්‍යාපන කලාපයේ ගොඩනැගිලි භාර ඉංජිනේරුවරයා හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා දැනුම්වත්වී නොසිටි බව දන්නේද;

(vii) භාවිතයට යෝග්‍ය ගොඩනැගිල්ලක් කඩා ඉවත් කිරීමට අනුමැතිය ලබාදුන් නිලධාරින්ට එරෙහිව පියවර ගන්නේද;

(viii) එම ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමෙන් පසුව, මේ වනවිට එම විද්‍යාලයට ශ්‍රවණාගාරයක් නොමැති වීම හේතුවෙන් සිසුන් දුෂ්කරතාවන්ට පත්ව සිටින බව දන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1787/2025

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිහිටුවීමේ අරමුණ කවරේද;

(ii) අම්පාර දිස්ත්‍රික්කය තුළ, කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එම ඉඩම් පිහිටා ඇති ග්‍රාම නිලධාරි කොට්ඨාස කවරේද;

(v) පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොමිෂන් සභාව මඟින් බෙදාදී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(vi) එම ඉඩම් ලබාදී ඇති පුද්ගලයින්ගේ නම් සහ අයත් ග්‍රාම නිලධාරි කොට්ඨාස කවරේද;

(vii) කොමිෂන් සභාවට අයත් ඉඩම්වලින් මේ වනවිට එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය ග්‍රාම නිලධාරි කොට්ඨාස අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(viii) ඉතිරිව ඇති ඉඩම්වලින් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහජන ක්‍රීඩාංගනයක් ඉදිකිරීමට හැකියාවක් තිබේද;

(ix) එසේ නම්, ඒ සඳහා ගත යුතු පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1913/2026

ගරු බී. ආරියවංශ මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ වාර්ෂික පොල් තෙල් නිෂ්පාදන ප්‍රමාණය වර්ෂ අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාලය තුළ පොල් තෙල් අපනයනය කර තිබේ නම්, එහි ප්‍රමාණය සහ එමඟින් උපයා ඇති ආදායම වර්ෂ අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම කාල සීමාව තුළ පොල් තෙල් ආනයනය කර තිබේ නම්, එහි ප්‍රමාණය සහ ඒ සඳහා වැය කරන ලද මුදල් ප්‍රමාණය වර්ෂ අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පොල් තෙල්වල ප්‍රමිතිය තහවුරු කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1943/2026

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වාවූ කාලසීමාව තුළ චන්ද්‍රිකා ඡායාරූප පදනම්ව උතුරු සහ නැගෙනහිර පළාත්වල සැලකිය යුතු භූමි ප්‍රමාණයක් වනාන්තර ලෙස ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත් කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, උතුරු පළාතේ ඇති වනාන්තර ප්‍රමාණය එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත ගැසට් නිවේදනයෙන් පසුව නව ගැසට් නිවේදන මඟින් තවත් ප්‍රදේශ වනාන්තර ලෙස ප්‍රකාශයට පත් කර තිබේද;

(iv) 2009 වර්ෂයෙන් පසු උතුරු පළාතේ වනාන්තර ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශවලින් ඉඩම් නිදහස් කර ඇති ප්‍රමාණය, නිදහස් කිරීමේ අරමුණු සහ ලබාගත් පාර්ශ්වයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වනාන්තර ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ තුළ ජනතාවගේ මඩ ඉඩම්, ගොඩ ඉඩම් සහ පදිංචි ඉඩම් ඇතුළත්වී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම ඉඩම්වල ප්‍රමාණය කොපමණද;

(iii) හිමිකම් ගැටලු විසඳා එම ඉඩම් ජනතාවට නැවත පවරා දීම සඳහා වැඩපිළිවෙළක් තිබේද;

(iv) එසේ නම්, එම ඉඩම් නැවත ලබා දෙන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2116/2026

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා,— ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2024 වර්ෂයේ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තාව අනුව ආබාධ සහිත ජනගහනය එක් එක් ආබාධ වර්ගය අනුව සංඛ්‍යාත්මකව සහ ප්‍රතිශතාත්මකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ජනගහනයෙන් ශ්‍රම බලකායට අයත් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සංඛ්‍යාව, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සහ ආබාධ වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ සේවා නියුක්ත ආබාධ සහිත පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2026 වර්ෂයේ අයවැය මඟින් ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය සේවයේ 3%ක කෝටාව ක්‍රියාත්මක කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) ආබාධ සහිත පුද්ගලයන් අතර රැකියා විරහිත සංඛ්‍යාව සහ ප්‍රතිශතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම පුද්ගලයන් රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ රැකියාවලට යොමු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2235/2026

ගරු දේවානන්ද සුරවීර මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ ස්ථාපිත ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මේ වනවිට පවතින ශාඛා සංඛ්‍යාව සහ එම ශඛාවල සේවයේ නියුතු සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) බැංකුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ ව්‍යාපෘති මඟින් ප්‍රතිලාභ ලබන ගනුදෙනුකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම බැංකුවේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ආයතනික යහපාලන මාර්ගෝපදේශ සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම බැංකුවේ පළාත් මට්ටමින් ක්‍රියාත්මක වන ප්‍රාදේශීය කාර්යාල වසා දැමීම සඳහා කටයුතු කරන්නේද;

(ii) බැංකුවේ පුරප්පාඩු 400ක් පමණ පවතින බවටත්, වර්තමාන සභාපතිවරයාගේ ධුර කාලය තුළ වර්ෂ 02ක පමණ කාලයක් සේවක උසස් වීම් අත්හිටුවා ඇති බවටත් වාර්තාවී ඇති කරුණු පිළිබඳව අවධානය යොමු කර තිබේද;

(iii) මේ වනවිට බැංකු ශාඛා 72ක ණය මුදාහැරීම් සීමා කර තිබේද;

(iv) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2290/2026

ගරු අබූබකර් අතම්බාවා මහතා,— වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සායින්දමරුදු විවිධ සේවා සමුපකාර සමිතියේ පසුගිය කාලය තුළ සිදුවූයේ යැයි පැවසෙන මහා පරිමාණ දූෂණ හා අක්‍රමිකතා හේතුවෙන් සමිතිය කෙරෙහි ජනතා විශ්වාසය බිඳ වැටී ඇති බවත්;

(ii) ගොඩනැගිලි අඩු මුදලකට බදු දීම, ඇතැම් බදුකරුවන් විසින් ඒවා අතුරු බදු දීම සහ දීර්ඝ කාලයක් මුළුල්ලේ හිඟ බදු අයකරගෙන නොමැති වීම වැනි අක්‍රමිකතා සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සමිතියේ ශාඛා සංඛ්‍යාව, පසුගිය නිලවරණය පැවැත්වූ දිනය සහ වර්තමාන කටයුතු කවරේද;

(ii) පසුගිය නිලවරණය දක්වා අතුරු සභාවක් මඟින් පරිපාලනය කළ කාලසීමාව කොපමණද;

(iii) ඡන්ද නාමලේඛනයේ අක්‍රමිකතා, බහුතර සාමාජිකයන් වයෝවෘද්ධ පුද්ගලයන් වීම, නව සාමාජිකයන් බඳවා ගැනීම නිශ්චිත පිරිසකට සීමා වීම සහ සමිතියේ සමාජ දායකත්වය පිළිබඳ තරුණ ප්‍රජාව දැනුම්වත් නොවීම සම්බන්ධයෙන් ගැටලු ඇති බව පිළිගන්නේද;

(iv) දූෂණ හා අක්‍රමිකතා හේතුවෙන් සිදුවූ අලාභ අයකර ගැනීම සහ සමිතියේ පරිපාලන අක්‍රමිකතා නිවැරදි කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2291/2026

ගරු සුනිල් රාජපක්ෂ මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පෞද්ගලික වැවිලි සමාගම් සහ රාජ්‍ය වැවිලි සමාගම්වලට අයත් වතු නිවාසවල ජීවත්වන ජනතාවට කම්කරු රැකියාවට අමතරව ස්වයං රැකියාවක හෝ ව්‍යාපාර කටයුත්තක නිරත වීමේ හැකියාව තිබේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නමින් ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ හැකියාව පවතින්නේද;

(iii) ව්‍යාපාර ලියාපදිංචි කිරීමේදී ව්‍යාපාර ස්ථානයේ අයිතිය තහවුරු කිරීම සඳහා පවතින ප්‍රතිපාදන කවරේද;

(iv) ප්‍රජා ශක්ති හෝ සමෘද්ධි සවිබල ගැන්වීමේ වැඩසටහන් සඳහා තෝරාගනු ලබන වතු නිවාසවල ජීවත්වන ජනතාවට කෘෂිකාර්මික හෝ සත්ත්ව පාලන කටයුතුවල නිරත වීම සඳහා ප්‍රයෝජනයට නොගන්නා වතු ඉඩම් ලබාදීමේ වැඩපිළිවෙළක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2360/2026

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශ රටවල මේ වනවිට පිහිටුවා ඇති ශ්‍රී ලංකා තානාපති කාර්යාල, මහ කොමසාරිස් කාර්යාල, කොන්සල් ජනරාල් කාර්යාල සහ කොන්සල් කාර්යාල සංඛ්‍යාව, ඒවා සතු කාර්යභාරය සහ වගකීම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම කාර්යාලවල කිසිදු වැටුපක් හෝ වෙනත් ප්‍රතිලාභයක් නොලබා ගරු සේවයේ යෙදී සිටින නිලධාරීන් සිටින්නේද;

(iii) එසේ නම්, එම නිලධාරීන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම කාර්යාල සහ කාර්ය මණ්ඩල නඩත්තු කිරීම සඳහා වාර්ෂිකව වැය කරන මුදල කොපමණද;

(ii) එම වියදමට සාපේක්ෂව එම කාර්යාල මඟින් ශ්‍රී ලංකාවට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ තක්සේරුවක් අර්ධ වාර්ෂිකව/වාර්ෂිකව සිදු කරන්නේද;

(iii) එසේ නම්, එය සිදු කරන ආකාරය කවරේද;

(iv) අවම කාර්ය සාධනයක් සහිත කාර්යාල හඳුනාගෙන තිබේද;

(v) එසේ නම්, එම කාර්යාල කවරේද;

(vi) එම කාර්යාලවල කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා දූත මණ්ඩල අලුතින් ආරම්භ කළ යුතු රටවල් හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, එම රටවල් සහ ඒ සඳහා හේතු කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

පා. 4/2024

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලංකාවේ සියලුම අධ්‍යාපන විද්‍යා පීඨ විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපන මට්ටම දියුණු ජාත්‍යන්තර තලයට ගෙන යාම උදෙසා පාසැල් පද්ධතියේ සියලුම ගුරුවරුන් පුහුණු උපාධිධාරී ගුරුවරුන් බවට පත් කිරීමට අවශ්‍ය වන හෙයින් ද, වර්තමානයේ බහුතරයක් ගුරුවරුන් හට තෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පාඨමාලාවක් අවසානයේ උසස් ඩිප්ලෝමාවක් හිමිවන හෙයින් ද, වසර තුනක න්‍යායාත්මක පාඨමාලාවක් සහ එක් වසරක පාසැල් කේන්ද්‍රීය පුහුණුවක් සහිත සිව් වසරක උපාධි පාඨමාලාවක් ප්‍රදානය කිරීම සඳහා උචිත වන සේ දැනට ක්‍රියාත්මක අධ්‍යාපන විද්‍යා පීඨ දහනවය විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීමට එවකට අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2020 පෙබරවාරි 13 දින ඉදිරිපත් කොට අනුමතිය ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණය බලාත්මක කිරීම සඳහා රජය විසින් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 5/2024

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— මී පැණි කර්මාන්තය වැඩිදියුණු කිරීම,— ඉතා ඉහළ ඖෂධීය ගුණයෙන් යුතු, දේශීය හා විදේශීය වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් ඇති මී පැණි කර්මාන්තය, දේශීය වශයෙන් වැඩිදියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 6/2024

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට වැඩිම ආදායමක් ලබා දෙන දුම්රිය මාර්ගයක් ලෙස කැලණිවැලි දුම්රිය මාර්ගය සලකනු ලබන හෙයින් ද, මෙම දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම තුළින් එහි ප්‍රතිලාභ රත්නපුර, බදුල්ල සහ හම්බන්තොට ඇතුළු දිස්ත්‍රික්ක රැසක ජනතාවට භුක්ති විඳිය හැකි වන හෙයින් ද, කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 8/2024

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳව ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලංකාවේ ආහාර කලාව, රසකාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංශ ගණනාවකින් සමන්විත වන බැවින්, ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීමේ ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මඟින් දේශීය හා විදේශීය ජනතාව අතර අප රටේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීමට මෙන්ම ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ලෝකය තුළ ඔසවා තැබීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 9/2024

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— පාසල් දරුවන්ගේ චර්යාකම සමාජගත කිරීම,— පාසැල් දරුවන් නිරන්තරයෙන් ඇසුරු කරන දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන්, පාසැල් වෑන් රථ රියැදුරන් ආදී පුද්ගලයන්ට දරුවන්ගේ චර්යාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක ක්‍රමවේද තුළින් සරලව පැහැදිලි කර රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම වෙනුවෙන් දරුවන් සමාජ අභියෝග හමුවේ ආරක්ෂා කළ යුතු ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීමේ ජාතික මට්ටමේ වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 10/2024

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— වතුකර ප්‍රදේශවල ක්‍රීඩා ක්ෂේත්‍රය දියුණු කිරීම,— වතුකර ප්‍රදේශවල ජීවත්වන තරුණ තරුණියන් ක්‍රීඩා ක්ෂේත්‍රයේ ජාතික හා ජාත්‍යන්තර මට්ටමෙන් තමන්ගේ හැකියාවන් ප්‍රදර්ශනය කර ඇති හෙයින් ද, ඔවුන් අධ්‍යාපනය හදාරන වතු පාසල්වල මෙන්ම ජීවත්වන වතු ප්‍රදේශවල ද ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා කිසිදු පහසුකමක් නොමැති හෙයින් ද, රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම පිණිස වතුකර ප්‍රදේශවල තරුණ තරුණියන්ගේ දායකත්වය ලබා ගැනීම සඳහා ප්‍රදේශයට අදාළ ක්‍රීඩා සංවර්ධනය උදෙසා වැඩසටහනක් දියත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ශ්‍රී ලංකා විදේශ සේවයේ පත්වීම් ලබාදීම විධිමත් කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ජාත්‍යන්තර ප්‍රජාව ඉදිරියේ ඔසවා තබන විදේශ සේවය සඳහා සිදු කරන ලද දේශපාලන පත් කිරීම් හේතුවෙන් එම සේවයේ ගුණාත්මකභාවය බිඳ වැටී අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වී

තිබෙන හෙයින් එම තත්ත්වය වළක්වාලීම සඳහා විදේශ සේවයට සිදු කරනු ලබන සියලුම පත් කිරීම් තරඟ විභාග ප්‍රතිඵල සහ කුසලතාවය මත සිදු කිරීමට රජය විසින් වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ලංගම ඩිපෝ සඳහා භාණ්ඩ හා සේවා මිල දී ගැනීමට නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයක් සකස් කිරීම,— ලංගම ඩිපෝ සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයක් නොමැති වීම, ලංකා ගමනාගමන මණ්ඩලයේ පවතින දූෂිත තත්ත්වයට ප්‍රධාන හේතුවක් වන හෙයින් මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා සුදුසු ප්‍රසම්පාදන ක්‍රමවේදයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා සතු විෂයයන් විද්‍යානුකූල ක්‍රමවේදයකට සකස් කිරීම,— වර්තමානය වනවිට පළාත් සභා සතු විෂයයන් කිසිදු විද්‍යානුකූල පදනමක් නොමැති ආකාරයකට වෙන් කර තිබෙන හෙයින් ද, එමඟින් විවිධ ගැටලු මතු වී තිබෙන හෙයින් ද, මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා එම විෂයයන් විද්‍යානුකූල පදනමක් මත නිසි ක්‍රමවේදයකට වෙන් කර දැක්වීමට සුදුසු වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ලංකා ගමනාගමන මණ්ඩලය ශක්තිමත් කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ පොදු ප්‍රවාහන සේවාව ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය කරුණක් හෙයින්, ලංකා ගමනාගමන මණ්ඩලය විසින් භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ දී සිදුවන වංචා හා දූෂණ වළක්වා ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— කිරි නිෂ්පාදනය ඉහළ දැමීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— වාර්ෂිකව කිරි ආනයනය කිරීම සඳහා විශාල වශයෙන් විදේශ විනිමය මෙරටින් බැහැර වන හෙයින් මෙම තත්ත්වය වළක්වාලීම සඳහා ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය ඉහළ දැමීමේ වැඩසටහනක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/2024

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ආයතන දේශපාලනීකරණයෙන් තොර කිරීම,— ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ආයතන දැඩි ලෙස දේශපාලනීකරණය වී ඇති බව පෙනී යන බැවින්, ඡන්දයෙන් තේරී පත් වන දේශපාලනඥයින් ක්‍රීඩා ආයතනවල නායකත්ව තනතුරු සඳහා තරග කිරීම සහ ඒවා හෙබවීම තහනම් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/2025

ගරු රවී කරුණානායක මහතා,— උද්ධමනයට සාපේක්ෂව 1%ක ප්‍රතිලාභයක් සේවකයින්ට ගෙවීම,— රජයේ ආයතන විසින් පරිපාලනය කරනු ලබන සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල විසින් වාර්ෂික උද්ධමන අනුපාතයට වඩා අවම වශයෙන් 1%කින් ඉහළ ප්‍රතිලාභ සේවා නියුක්තිකයින්ට ලැබෙන බවට වගබලා ගත යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/2025

ගරු රවී කරුණානායක මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා නොමිලේ ගමන් පහසුකම් සැපයීම,— සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා පොදු ප්‍රවාහන සේවා තුළ නොමිලේ ප්‍රවාහන පහසුකම් සැපයිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 34/2025

ගරු රවී කරුණානායක මහතා,— නව නිපැයුම්කරුවන් ලෝකයට හඳුන්වාදීම සඳහා ජාතික වැඩසටහනක් සකස් කිරීම,— විවිධ කුසලතාවලින් පිරිපුන් නව නිපැයුම්කරුවන් සහ පුරවැසියන් ලෝකයට හඳුන්වාදීම සඳහා සහ ඔවුන්ගේ කුසලතා සහ නිර්මාණ වැඩිදියුණු කිරීම සඳහා ජාතික වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 35/2025

ගරු රවී කරුණානායක මහතා,— දේශීය අමුද්‍රව්‍ය භාවිතා කරන කර්මාන්තකරුවන්ට බදු සහන,— ජාත්‍යන්තර වෙළඳපොළ සඳහා භාණ්ඩ නිෂ්පාදනය කිරීමේදී, 75% කට වඩා දේශීය අමුද්‍රව්‍ය භාවිතා කරන දේශීය කර්මාන්තකරුවන්ට, වසර දෙකක බදු සහනයක් ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 36/2025

ගරු රවී කරුණානායක මහතා,— ඡන්දය ප්‍රකාශ කිරීමට ඇති අයිතිය ලබා දීම,— ලියාපදිංචි ඡන්දදායකයින් වැඩි සංඛ්‍යාවකට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඇති අයිතිය අහිමි වී ඇති හෙයින් වඩාත් සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියක් නිර්මාණය කිරීම උදෙසා වයස අවුරුදු දහ අටට වැඩි සෑම පුද්ගලයෙකුටම ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීමටත්, ඡන්ද හිමි නාමලේඛනයේ නම සඳහන් වීමෙන් පසු යම් පුද්ගලයෙකු ඡන්දය ප්‍රකාශ නොකරන්නේ නම් ඔවුන්ට දඩ නියම කිරීමටත් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 41/2025

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ව්‍යවස්ථාව ඇතුළු සංයුතිය වෙනස් කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— වර්තමානය වනවිට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සම්බන්ධව සමාජයේ විශාල කතිකාවක් නිර්මාණය වී තිබෙන හෙයින්ද, එහි නිලවරණයේ දී එක්තරා සමිති කණ්ඩායමක් සතුව ක්‍රිකට් ආයතනයේ බලය පැවතීම හේතුවෙන් අක්‍රමිකතා බහුලව සිදුවන ආයතනයක් බවට පත්වී ඇති හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා ක්‍රිකට් ආයතනයේ ව්‍යවස්ථාව ඇතුළු සංයුතිය සංශෝධනය කිරීමට රජය විසින් අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 44/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— ශ්‍රී ලංකා වරාය අධිකාරිය සම්බන්ධයෙන් 2023 වර්ෂයේ විගණන වාර්තාවේ දැක්වෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම,— ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ හදවත බඳු ශ්‍රී ලංකා වරාය අධිකාරිය සම්බන්ධයෙන් ඉතා වැදගත් නිර්දේශ ජාතික විගණන වාර්තාවේ දක්වා ඇති හෙයින් එම නිර්දේශ ක්‍රියාවට නැංවීමට විධිමත් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 45/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල මුදල් නිසි ලෙස මහජන සේවා සඳහා යෙදවීම,— වර්තමානය වනවිට බොහෝ පළාත් පාලන ආයතන සිය මුදල් නිසි ලෙස මහජන, සෞඛ්‍ය පොදු සේවා සහ පොදු මාවත් දියුණු කිරීම වැනි කටයුතු සඳහා නොයොදවා ලාභ ඉපැයීමේ අරමුණින් ස්ථාවර තැන්පතුවල තැන්පත් කොට ඇති බවට කරුණු අනාවරණය වී ඇති හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීමට රජය විසින් සුදුසු වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 49/2025

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ඉන්ධන පිරවුම්හල් සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රියාදාමය නියාමනය කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ ඉන්ධන පිරවුම්හල් බලපත්‍ර ලබාදීමේ ක්‍රියාදාමය දැඩි අවිධිමත් තත්ත්වයක පවතින බැවින්, එම තත්ත්වය විධිමත් කිරීම සඳහා නියාමන වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 51/2025

ගරු රවී කරුණානායක මහතා,— ජාතික භාෂා පීඨයක් පිහිටුවීම,— ගුරුවරුන් සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා උගන්වනු පිණිස ජාතික භාෂා පීඨයක් පිහිටුවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 52/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාගත් ණය වින්දිතයින් බවට පත් වූ පුද්ගලයින්ට සාධාරණය ඉටු කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාගත් පිරිසෙන් අති බහුතරයක් මේ වනවිට ණය වින්දිතයින් බවට පත්ව සිටින බැවින්, එම පිරිසට සාධාරණය ඉටු කිරීම සඳහා වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 53/2025

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ටෙලි නාට්‍ය කර්මාන්තය දියුණු කිරීම සඳහා සහ එම කර්මාන්තය නියාමනය කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ජනතාවට විනෝදාස්වාදය සපයන ප්‍රධාන කර්මාන්තයක් වන ටෙලි නාට්‍ය කර්මාන්තය දියුණු කිරීම සඳහා සහ එම කර්මාන්තය නියාමනය කිරීම සඳහා යම් නියාමන ආයතනයක් ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 56/2025

ගරු උපුල් කිත්සිරි මහතා,— උඩවලව ප්‍රදේශය සංචාරක කලාපයක් ලෙස නම් කිරීම,— උඩවලව ජාතික වනෝද්‍යානය, උඩවලව ඇත් අතුරු සෙවණ, සංඛපාල රජමහා විහාරය, උඩවලව ජලාශය, සෙවනගල සීනි කර්මාන්තශාලාව, සෙවනගල උක් පර්යේෂණ ආයතනය, උඩවලව මිරිදිය ධීවර මධ්‍යස්ථානය සහ වවුල්පන හුණුගල් ගුහාව ආදී වූ සංචාරක ආකර්ශණය ලබාගත හැකි ස්ථාන තිබුණද විධිමත් වැඩපිළිවෙළක් නොමැතිවීම හේතුවෙන් දෙස් විදෙස් සංචාරකයන්ට එහි වටිනාකම් ලබාගැනීමට නොහැකි වී ඇති හෙයින් රත්නපුර දිස්ත්‍රික්කයේ උඩවලව ප්‍රදේශය සහ මොනරාගල දිස්ත්‍රික්කයේ සෙවනගල ප්‍රදේශය ආවරණය වන පරිදි උඩවලව ප්‍රදේශය සංචාරක කලාපයක් ලෙස නම් කිරීම සඳහා රජය විසින් සුදුසු පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 57/2025

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා,— "ශ්‍රී ලංකා බයිතුල්මාල් අරමුදල" නමින් අරමුදලක් ආරම්භ කිරීම,— ශ්‍රී ලංකාව තුළ ජීවත්වන මුස්ලිම් ජනතාවගේ අධ්‍යාපනය, සංස්කෘතිය, රැකියාව සහ ජාතීන් අතර පවතින සහයෝගීතාවය සම්බන්ධ ගැටලුවලදී හා එදිනෙදා ජීවනෝපායයන් ඉටුකර ගැනීමේ දී අවශ්‍ය වන අරමුදලක් මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සතුව දැනට නොමැති හෙයින් ද, මෙම අවශ්‍යතාවයන් සඳහා "බයිතුල්මාල්" නමින් අරමුදලක් ලෝකයේ මුස්ලිම් රටවල්වල සහ මුස්ලිම් සුළු ජාතීන් ජීවත්වන රටවල්වල වසර ගණනාවක සිට ස්ථාපනය කර ඇති හෙයින් ද, මෙම අරමුදල ශ්‍රී ලංකාවේ ආරම්භ කළහොත් අවශ්‍ය මුදල් ප්‍රතිපාදන මෙරට ජීවත්වන අයගෙන් සහ විදේශීය රටවල්වල ජීවත්වන අයගෙන් සම්පාදනය කරගත හැකිවන හෙයින් ද, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ "ශ්‍රී ලංකා බයිතුල්මාල් අරමුදල" නමින් අරමුදලක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදුකරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 62/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය කාර්යක්ෂම කිරීම,— ශ්‍රී ලංකාවේ දුම්රිය සේවය ආරම්භ කිරීමේ මුඛ්‍ය පරමාර්ථය වූයේ භාණ්ඩ ප්‍රවාහනය හෙයින්ද, මේ වනවිට දුම්රිය සේවය එයින් බැහැර වී ඇති හෙයින්ද, දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය වියදම් අඩු ක්‍රමයක් වන හෙයින්ද, එහි ප්‍රතිලාභ රටේ ජනතාවට සෘජුවම අත්වන හෙයින්ද, හැකි සෑම අවස්ථාවකදීම දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය මෙන්ම ඉන්ධන ප්‍රවාහනය සඳහා රජය විසින් නිසි ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 63/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— සිය කෘෂි නිෂ්පාදන අලෙවි කිරීමේ දී ගොවීන්ට සිදුවන අසාධාරණය අවම කිරීම,— සිය කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවි කිරීමේදී තොග වෙළඳුන් මෙන්ම සිල්ලර වෙළඳුන් විසින් ද ඉතා අඩු මුදලක් නියම කිරීම හේතුවෙන් මෙරට ගොවීන් බරපතල අසාධාරණයකට ලක්වන හෙයින්ද, එකී භාණ්ඩ වෙළඳුන්ගෙන් මිලදී ගැනීමේදී පාරිභෝගික ජනතාවට වැඩි මිලක් ගෙවීමට සිදුව ඇති හෙයින්ද, ගොවියාත්, පාරිභෝගිකයාත් එකවර අසාධාරණයන්ට ලක් කරන්නා වූ මෙකී ක්‍රියාදාමයන් වෙනස් කරමින්, ගොවියාට සහ පාරිභෝගිකයාට සාධාරණයක් ඉටු කර දීම වෙනුවෙන් රජය විසින් කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 64/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— පෙර පාසල් අධ්‍යාපනය නියාමනය කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම,— මේ වනවිට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක සියලුම අධ්‍යාපන අවස්ථා අතරින් පෙර පාසල් අධ්‍යාපනය අතිශය වැදගත් සහ තීරණාත්මක වන හෙයින්, ශ්‍රී ලංකාවේ පෙර පාසල් අධ්‍යාපනය එක් ආයතනයකින් නියාමනය කිරීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 65/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— අපනයන නිෂ්පාදකයින්ට පහසුකම් සැපයීම,— අපනයනය ඉලක්ක කර ගනිමින් කෘෂිකාර්මික සහ වෙනත් භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදකයන්ට අපනයන වෙළඳපොළට ප්‍රවේශ වීම සඳහා ප්‍රමාණවත් තරම් පහසුකම්, දැනුම සහ ප්‍රවේශ මාර්ග නොමැති හෙයින්, විදේශ විනිමය උත්පාදනයේ ප්‍රධාන සංරචකයන් වන අපනයන ක්ෂේත්‍රයේ නියැළි තරුණ ව්‍යවසායකයින්ට ඒ සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 66/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— උසස් පෙළ විද්‍යා, වාණිජ සහ තාක්ෂණවේදය විෂය ධාරාවන්ට සාහිත්‍යය විෂය හඳුන්වා දීම,— ශ්‍රී ලංකාවේ පාසල්වල විද්‍යා, වාණිජ සහ තාක්ෂණවේදය විෂය ධාරාවන්ගෙන් උසස් පෙළ හදාරන සිසුන්ගේ සාහිත්‍ය රසාස්වාදය ඉහළ නැංවීම සඳහා එම විෂය ධාරාවන් සඳහා අමතර විෂයයක් ලෙස සාහිත්‍යය විෂය හඳුන්වා දියයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 67/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— රෝහල්වල නේවාසික රෝගීන්ට උපස්ථානය සැලසීම,— රෝහලක නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගියෙකු අසල, රෝගියාගේ රැකවරණය සඳහා දිවා හා රාත්‍රී කාලයන්හි භාරකරුවෙකු නතර කළ යුතු බවට වාට්ටු භාර හෙද නිලධාරින් විසින් දැනුම් දෙනු ලබන හෙයින්ද, එලෙස භාරකරුවෙකු නොමැති අවස්ථාවකදී පෞද්ගලික උපස්ථාන සේවකයින් ගාස්තු ගෙවා ලබා ගත යුතුව ඇති හෙයින්ද, එකී උපස්ථාන සේවකයින් දිනකට රු. 3500 ක පමණ මුදලක් අය කරන හෙයින්ද, දින කිහිපයක් රෝහල් ගතව සිටීමට සිදු වුවහොත් එය දරා ගැනීමට අපහසු මුදලක් වන හෙයින්ද, රෝහලක නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගියෙකුගේ රැකවරණය සහ උපස්ථානය, රෝහලේ සේවය කරනු ලබන උපස්ථායකවරුන් විසින් ලබා දීමේ ක්‍රමවේදයක් රජය විසින් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 68/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— ඉඩම් සඳහා බලපත්‍රලාභී ඔප්පු හිමියන්ට ස්ථිර ඔප්පු ලබා දීම,— රටේ ජනතාවගෙන් සැලකිය යුතු පිරිසකට ස්වකීය ඉඩම සඳහා හිමිව ඇත්තේ බලපත්‍ර හෝ ස්වර්ණ භූමි වැනි ඔප්පු වන හෙයින්, ඔවුන් සඳහා ඔප්පු ලබා දීමේ නිවැරදි ක්‍රමවේදයක් සැකසිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 71/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— යාපනය සහ උතුරු පළාත තුළ තරුණයන් සඳහා තිරසර රැකියා අවස්ථා නිර්මාණය කිරීම පිණිස ස්ථිර විශේෂ ආර්ථික කලාපයක් පිහිටුවීම,— ස්ථිර විශේෂ ආර්ථික කලාපයක් පිහිටුවීම මඟින් රජයට ආර්ථික වර්ධනය උත්තේජනය කොට දේශීය හා විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගනිමින් තරුණයින් සඳහා තිරසර රැකියා අවස්ථා ජනනය කළ හැකි හෙයින් ද, එවැනි කලාප සංවර්ධනය කිරීමෙන් රජයට කාර්මික ව්‍යාප්තිය ප්‍රවර්ධනය කිරීම, කුසලතා සංවර්ධනය වැඩි දියුණු කිරීම හා ව්‍යවසායකත්වය දිරිමත් කිරීම තුළින් විරැකියාවට විසඳුම් ලබාදිය හැකි හෙයින් ද, යාපනයේ උතුරු පළාතේ සහ සමස්තයක් වශයෙන් රටේ දිගුකාලීන සමාජ-ආර්ථික ප්‍රගතියක් ඇති කිරීමට රට පුරා අනෙකුත් උපායමාර්ගික ස්ථාන වලට සමගාමීව යාපනයේ සහ උතුරු පළාතේ ද ස්ථිර විශේෂ ආර්ථික කලාපයක් (SEZ) ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 73/2025

ගරු රවි කරුණානායක මහතා,— ශ්‍රී ලාංකිකයන්ට සෞඛ්‍ය සම්පන්නභාවය සඳහා වඩා හොඳ අවස්ථා ලබා දීම,— ජනගහනයෙන් බහුතරයක් විවෘත හදවත් සැත්කම්වලට භාජනය වන හෙයින්, ශ්‍රී ලාංකිකයන්ට සෞඛ්‍ය සඳහා වඩා හොඳ අවස්ථා ලබා දිය යුතු බවටත්, ඒ සඳහා පෞද්ගලික අංශයේ සේවකයන්ට සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල හරහාද, රජයේ සේවකයින්ට සහ රැකියා නියුක්තිකයන් නොවන අයට රජය විසින් ජනාධිපති අරමුදල හරහාද පූර්ණ පිරිවැය සහිතව නොමිලේ පහසුකම් සලසා දිය යුතු බවටත් මෙම සභාව යෝජනා කර සිටී.

පා. 74/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— සතියේ වැඩ කරන දිනවල ප්‍රධාන නගර ආශ්‍රිතව උදෑසන කාලයේ දී සහ සවස් කාලයේ දී බස් ප්‍රමුඛතා මංතීරු කඩිනමින් ඇති කිරීම,— ප්‍රධාන නගර ආශ්‍රිතව උදෑසන හා සවස් කාලයේදී පවතින දැඩි මාර්ග තදබදයට පිළියමක් ලෙස උදෑසන සහ සවස් කාලයන්හිදී බස් ප්‍රමුඛතා මංතීරු ක්‍රමයක් ක්‍රියාවට නැංවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 75/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— ඉතාලි-ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික රියදුරු බලපත්‍ර ගිවිසුම යාවත්කාලීන කිරීම,— ඉතාලි-ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික රියදුරු බලපත්‍ර ගිවිසුම මඟින් ශ්‍රී ලාංකිකයන්ට විශාල ප්‍රතිලාභ හිමිවන හෙයින්, එම ගිවිසුම නැවත යාවත්කාලීන කිරීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 76/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— සුහුරු විදුලිබල පද්ධතියක් සහ සුහුරු මීටර් හඳුන්වා දීම,— පුනර්ජනනීය බලශක්ති ප්‍රභේදයක් ලෙස සූර්ය බලශක්තිය ප්‍රවර්ධනය ඉතා වැදගත් වුවත්, විශේෂයෙන්ම වහල මත සවිකරන ලද සූර්ය පැනල මඟින් ජනනය වන විදුලි ප්‍රමාණය, පද්ධති පාලන මධ්‍යස්ථානයේදී වෙන්කර හඳුනාගත නොහැකි හෙයින්, ජාතික විදුලිබල පද්ධතිය (Grid) සුහුරු තත්ත්වයට (Smart Grid) පත්කිරීමටත්, සුහුරු මීටර් (Smart Meters) හඳුන්වා දීමටත් කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 77/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— ආහාර රස ගැන්වීමට යොදන අහිතකර කෘත්‍රිම රසකාරක තහනම් කිරීම,— රයිස්, කොත්තු හා නූඩ්ල්ස් වැනි ආහාර රස ගැන්වීමට මෙරට ආපනශාලා සහ හෝටල්වලදී යොදන කෘත්‍රිම රසකාරක, නොයෙක් බෝ නොවන රෝගවලට හේතු වන බව වාර්තාවන හෙයින්, ඒ පිළිබඳව පිළිගත් ආයතනයක් මඟින් නිසි අධ්‍යයනයක් සිදුකර, එම අහිතකර රසකාරක තහනම් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 79/2025

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය,— ජපන් ජබර ශාකයේ ව්‍යාප්තිය හිතකර ලෙස පාලනය සහ මර්දනය කිරීම,— ජපන් ජබර නොහොත් Eichhornia crassipes (Mart.) Solms යන විද්‍යාත්මක නාමයෙන් හඳුන්වන ආක්‍රමණශීලී ශාකය, වර්තමානයේ ගොවි බිම් සහ වගුරු බිම් වසා පැතිරී ගොස් ඇති හෙයින් ද, මෙහි ශීඝ්‍ර වර්ධන වේගය හේතුවෙන් දේශීය ශාක අභිබවා ජෛව පරිසර පද්ධතියට තර්ජනයක් වී ඇති හෙයින් ද, මෙම තත්ත්වය හේතුවෙන් රොන් මඩ තැන්පත් වී ජල ප්‍රවාහන මාර්ග සහ ජල බැස්ම අවහිර වීම මඟින් ජල ගැලීම් හා ගංවතුර තත්ත්ව ඇති වී ඇති හෙයින් ද, එදිනෙදා භාවිතයට අවශ්‍ය වන ජලයේ තත්ත්වයට හානිවීම සහ ජල විදුලි උත්පාදනයේදී බාධා ඇති වී ඇති හෙයින් ද, රසායනික වල් නාශක භාවිතය මඟින් ඒවා මර්දනය එම ජලය පරිහරණය කරන පුද්ගලයින්ට සෞඛ්‍ය අවදානමක් ඇති කරන හෙයින් ද, මදුරු කීටයන් බෝවීම හා එමඟින් බරවා හා ඩෙංගු වැනි රෝග ව්‍යාප්තවීම සිදු වී ඇති හෙයින් ද, මෙම ශාකය හිතකර ලෙස පාලනය හා මර්දනය මඟින් තිරසර විසඳුමක් උදෙසා රජය විසින් අදාළ ව්‍යාපෘති යෝජනා සැකසීම කාලෝචිත බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 82/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— ආයතන ප්‍රධානීන් පත්කිරීමේ නිර්ණායකයක් ලෙස ප්‍රධාන කාර්ය සාධන දර්ශකය යොදා ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම,— රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත්කිරීමේ දී ජ්‍යෙෂ්ඨත්වය සේම ඔවුන්ගේ ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (KPl - Key Performance Indicator) නිර්ණායකයක් ලෙස යොදා ගැනීම සඳහා ක්‍රමවේදයක් රාජ්‍ය සේවයට ඇතුළත් කොට, ඒ අනුව ආයතන ප්‍රධානීන් පත්කිරීමට නිර්දේශ ලබා ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 83/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ අමාත්‍යවරුන් හට තනතුරු ලබා දීමේ දී ප්‍රධාන කාර්ය සාධන දර්ශකය සලකා බැලීම, — පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහ අමාත්‍යවරුන්ගේ ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (KPI - Key Performance Indicator) වාර්ෂිකව පරීක්ෂා කර, ඔවුන්ට තනතුරු ලබා දීමේ දී එකී දර්ශකය සලකා බලා, තනතුරු ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 84/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— අග්‍ර විනිශ්චයකාරවරයාගේ සිට අධිකරණ ක්ෂේත්‍රයේ පහළ නිලයන් දක්වා තනතුරු දැරූ තැනැත්තන් වෙනත් තනතුරුවලට පත්කිරීමේ දී ඔවුන්ගේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම, — අග්‍ර විනිශ්චයකාරවරයාගේ සිට අධිකරණ ක්ෂේත්‍රයේ පහළ නිලයන් දක්වා තනතුරු දැරූ තැනැත්තන්, ඔවුන්ගේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම වෙනුවෙන්, එකී තනතුරු දැරීම නතර වූ තැන් සිට අවම වශයෙන් වසර තුනක කාලයක් රාජ්‍ය සේවයේ, සංස්ථාපිත මණ්ඩල, කොමිෂන් සභා, විනිශ්චය මණ්ඩලවල හෝ විදේශ සේවයේ (තානාපති වැනි) තනතුරුවලට පත් නොකළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 86/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— දේශපාලන පක්ෂ විසින් මහජන නියෝජිතයින්ගේ වැටුප්, දීමනා සහ වාහන බලපත්‍ර ආදිය තම පක්ෂවල අරමුදල් සඳහා බැර කර ගැනීම නතර කිරීම,— දේශපාලන පක්ෂ විසින් තම පක්ෂයෙන් තේරී පත් වූ මහජන නියෝජිතයින්ගේ මාසික වැටුප්, දීමනා සහ වාහන බලපත්‍ර ආදිය එම පක්ෂවලට ලබා ගැනීම මහජන නියෝජිතයින්ගේ ස්වාධීනත්වය අහෝසි වන ක්‍රියාවක් වන හෙයින් ද, එය ප්‍රජාතන්ත්‍රවාදයට බරපතල අභියෝගයක් වන හෙයින් ද, මෙලෙස දේශපාලන පක්ෂ විසින් මහජන නියෝජිතයින්ගේ වැටුප්, දීමනා සහ වාහන බලපත්‍ර ආදිය තම පක්ෂවල අරමුදල් සඳහා බැර කර ගැනීම නොකළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 87/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— සෑම දිස්ත්‍රික්කයකම මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීම,— මේ වනවිට හෙරොයින් වැනි මත් ද්‍රව්‍ය භාවිතා කරන්නන්ගේ ශීඝ්‍ර වර්ධනයක් දක්නට ලැබෙන හෙයින් ද, ඒ සඳහා ඇබ්බැහිවූවන් ප්‍රදේශයකට සීමා නොවී රට පුරා ව්‍යාප්තව සිටීම සහ ඔවුන්ගෙන් ප්‍රචාරණය වීම මෙයට හේතු වී තිබෙන හෙයින් ද, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීමේ මධ්‍යස්ථාන රට පුරා ස්ථාන කිහිපයක පමණක් පැවතීම මත් ද්‍රව්‍ය භාවිතා කරන්නන්ගේ වර්ධනය පාලනය කිරීමට දැඩි ගැටලුවක්ව ඇති හෙයින් ද, එයට විසඳුමක් ලෙස සියලු පහසුකම් සහිතව අවම වශයෙන් දිස්ත්‍රික්කයකට එක් පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 89/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ඉඩම් වඩාත් ඵලදායි ලෙස භාවිතා කිරීම,— ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය රටේ ආර්ථිකයේ මූලික අංශයක් වන හෙයින් ද, වාර්ෂිකව නිෂ්පාදන ක්‍රියාවලියට යොදවනුයේ කෘෂිකාර්මික ඉඩම්වලින් 40%කට ආසන්න ප්‍රමාණයක් පමණක් වන හෙයින් ද, ඉතිරි ඉඩම් නිසි ලෙස සැලසුම් නොකිරීම, ජල සම්පත් හිඟය, තාක්ෂණික දැනුම නොමැති වීම සහ නව්‍යකරණය නොවීම හේතුවෙන් භාවිතා නොවන හෙයින් ද, නිෂ්පාදන මට්ටම අඩු වීම මඟින් ආහාර ආනයනය සඳහා වසරකට විශාල මුදලක් වැය වන හෙයින් ද, කෘෂිකාර්මික නිෂ්පාදනයේ වර්ධනය ඉදිරි වසර කිහිපය තුළ 30%කින් වැඩි කිරීමටත්,

ඉන් ගොවීන්ගේ ආදායම වැඩි කිරීමටත්, වාණිජ කෘෂිකර්මයේ ව්‍යාප්තිය වැඩි කිරීමටත්, සියලුම කෘෂිකාර්මික භූමි ගවේශණය කර, භූමියෙහි වර්ගය, බෝගවලට යෝග්‍ය බව, ජලය සහ ගොවිතැන පිළිබඳ තොරතුරු ඇතුළත් මූලික දත්ත පද්ධතියක් සකස් කිරීම මඟින් රටේ ආහාර සුරක්ෂිතතාව ඇති කිරීමටත්, ගොවීන්ගේ ජීවන මට්ටම උසස් කිරීමටත්, ඉඩම් වඩාත් ඵලදායි ලෙස භාවිතා කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 90/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— යාපනය දිස්ත්‍රික්කයේ අක්වෙරළ දූපත්වල පදිංචිකරුවන් සඳහා මුහුදු ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීම,— යාපනය දිස්ත්‍රික්කයේ විශේෂයෙන් නෙඩුන්තිව්, නයිනතිව්, එලුවයිතිව් සහ අනලයිතිව් වැනි අක්වෙරළ දූපත්වල පදිංචිකරුවන්ට දශක ගණනාවක් තිස්සේ ප්‍රමාණවත් මුහුදු ප්‍රවාහන පහසුකම් අහිමි වී ඇති හෙයින් ද, එහි ප්‍රතිඵලයක් ලෙස, ඔවුන්ට මුහුදු මාර්ගයෙන් පැය කිහිපයක් ගමන් කිරීමට සිදු වන හෙයින් ද, රෝගීන්, ගර්භනී කාන්තාවන්, වැඩිහිටියන්, පාසල් කාර්ය මණ්ඩලය සහ රාජ්‍ය නොවන සංවිධානවල සේවකයින් මෙම ගමන්වලදී දැඩි දුෂ්කරතා සහ අවදානම්වලට මුහුණ දෙන හෙයින් ද, "ගම් සංවර්ධනය ජාතියේ සංවර්ධනය" බව පිළිගෙන ඇති හෙයින් ද, එම දූපත්වල පදිංචිකරුවන්ට නවීන, ආරක්ෂිත, වේගවත් සහ විශ්වාසදායක මුහුදු ප්‍රවාහන පහසුකම් සැපයීමට රජය වහාම පියවර ගත යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 91/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— තලෙයිමන්නාරම-රාමේෂ්වරම් බෝට්ටු සේවාව ආරම්භ කිරීම,— තලෙයිමන්නාරම-රාමේෂ්වරම් බෝට්ටු සේවය ආරම්භ කිරීම මඟින් විශේෂයෙන්ම ඉන්දියාවේ සිට මෙරටට සංචාරකයින් පැමිණීම වැඩි කරනු ලැබිය හැකි හෙයින් ද, එමඟින් මහජනතාවට අඩු වියදමකින් තමිල්නාඩුවට ගමන් කර පවතින නීති හා රෙගුලාසිවලට යටත්ව දැරිය හැකි මිලකට අත්‍යවශ්‍ය භාණ්ඩ මිල දී ගැනීමට හැකියාව ලබා දී ඔවුන්ගේ ජීවනෝපායන් වැඩිදියුණු කළ හැකි හෙයින් ද තලෙයිමන්නාරම-රාමේෂ්වරම් බෝට්ටු සේවාව ආරම්භ කිරීම සඳහා රජය වහාම පියවර ගත යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 95/2025

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— පෞද්ගලික බස්රථ සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදය විධිමත් කිරීම,— පළාත්බද මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මඟින් සිදුකරන පෞද්ගලික බස්රථ සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය අතිශයින් දූෂිත තත්ත්වයට පත්වී තිබෙන බැවින්, එම තත්ත්වය වැළැක්වීම සඳහා සුදුසු වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 98/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— 'සූර්ය බල සංග්‍රාමය' ව්‍යාපෘතිය ප්‍රවර්ධනය කිරීම,— ශ්‍රී ලංකාවේ බලශක්ති මූලාශ්‍රයන් අතරින් සූර්ය විදුලි බලය ලාබදායි සහ පරිසර හිතකාමී මූලාශ්‍රයක් ලෙස හඳුනාගෙන ඇති හෙයින් ද, 2016.09.06 දින ආරම්භ කරන ලද 'සූර්ය බල සංග්‍රාමය' (Battle for Solar Energy) ව්‍යාපෘතිය මඟින් දැනටමත් ජාතික විදුලි පද්ධතියට

සූර්ය විදුලි බලය 2000 MWට වැඩි ප්‍රමාණයක් එක් කර ඇති හෙයින් ද, විදුලි ඒකකයක මිල අඩු කිරීමේ ක්‍රමවේදයක් සහ පරිසරය ආරක්ෂා කිරීමේ උපාය මාර්ගයක් ලෙස, 'සූර්ය බල සංග්‍රාමය' ව්‍යාපෘතිය තවදුරටත් ප්‍රවර්ධනය කොට ආරක්ෂා කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 99/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— 'කළුතර මුහුදු වෙරළ කලාපය' විශේෂිත ආර්ථික කලාපයක් ලෙස ප්‍රවර්ධනය කිරීම,— කළුතර නගරය මුල් කරගත් සංචාරක කලාපයක් සංවර්ධනය කිරීම වෙනුවෙන් ද, කළු ගඟේ මෝය සහ මුහුදු වෙරළ ආරක්ෂා කිරීමේ උපාය මාර්ගයක් ලෙස ද, කැලිඩෝ මුහුදු වෙරළ සහ කළු ගඟේ මෝය වෙනස් වීම හේතුවෙන් අලුතින් බිහිවී ඇති ගොඩබිම ඇතුළත්, 'කළුතර මුහුදු වෙරළ කලාපය', විශේෂිත ආර්ථික කලාපයක් ලෙස ප්‍රවර්ධනය කොට සංවර්ධනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 100/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— 'මිල්ලනිය අපනයන සැකසුම් කලාපය' ඉදිකිරීම කඩිනම් කිරීම,— කළුතර දිස්ත්‍රික්කයේ, 'මිල්ලනිය අපනයන සැකසුම් කලාපය' (Millaniya Export Processing Zone) සඳහා අවශ්‍ය ඉඩම් අක්කර 240ක් දැනටමත් පවරා ගෙන ඇති හෙයින් ද, එම ව්‍යාපෘතිය සඳහා අධිවේගී මාර්ග පිවිසුම්, නළ ජලය සහ විදුලිය ලබා දීම සඳහා රජය විසින් රුපියල් බිලියනයකට ආසන්න මුදලක් දැනටමත් වැයකර ඇති හෙයින් ද, එම අපනයන සැකසුම් කලාපය සඳහා තෝරාගත් භූමිය එවැනි ව්‍යාපෘතියක් සඳහා සුදුසු බවට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් දැනටමත් හඳුනාගෙන ඇති හෙයින් ද, එම අපනයන සැකසුම් කලාපය ඉදිකිරීම රජයේ ප්‍රමුඛ ව්‍යාපෘතියක් ලෙස සලකා අවශ්‍ය ඉදිරි පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 101/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ඉංග්‍රීසි භාෂාවෙන් ද්විතියික අධ්‍යාපනය ලබාදීම ප්‍රවර්ධනය කිරීම,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18(3) ව්‍යවස්ථාව ප්‍රකාරව 'ඉංග්‍රීසි භාෂාව' ශ්‍රී ලංකාවේ සන්ධාන භාෂාව (Link Language) ලෙස පිළිගෙන ඇති හෙයින් ද, ජාත්‍යන්තර භාෂාවක් වන 'ඉංග්‍රීසි භාෂාව' පුරවැසියන්ට දැනුම ලබා ගැනීමේ ප්‍රධාන උපාය මාර්ගයක් ලෙස හඳුනාගෙන ඇති හෙයින් ද, ශ්‍රී ලංකාවේ සියලු පුරවැසියන්ට භාෂා හෝ ජාති භේදයක් නොමැතිව එකම රටක ජීවත් වීම සඳහා අවශ්‍ය වන සන්ධාන භාෂාව ලෙස ඉංග්‍රීසි භාෂාවේ ප්‍රවීණතාවය ලබා ගැනීම ඉතා වැදගත් වන හෙයින් ද, නිදහස් අධ්‍යාපන සංකල්පය තුළ බිහි වූ ශ්‍රී ලංකාවේ මධ්‍ය මහා විද්‍යාල පද්ධතිය තුළ සහ තවත් පාසැල් ගණනාවක ඉංග්‍රීසි භාෂාවෙන් ද්විතීයික අධ්‍යාපනය ලබාදීමේ ක්‍රමවේදය සාර්ථක වී ඇති හෙයින් ද, ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට ජාත්‍යන්තර රැකියා අවස්ථාවන් ලබා ගැනීම උදෙසා ඉංග්‍රීසි භාෂාවෙන් ලැබෙන අධ්‍යාපනය අතිශය වැදගත් වන හෙයින් ද, ශ්‍රී ලංකාවේ සියලුම ද්විතියික පාසැල් වල (Secondary Schools) ඉංග්‍රීසි මාධ්‍යයෙන් (English Medium) අධ්‍යාපනය ලබා දිය යුතු යැයි ද, ඒ සඳහා ප්‍රමාණවත් ආයෝජනයක් සිදු කිරීම සඳහා රජය ප්‍රමුඛතාවය ලබා දිය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 102/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සඳහා ඉංජිනේරු පීඨයක් ස්ථාපනය කිරීම,— ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය දේශීය හා විදේශීය රැකියා වෙළඳපොළ තුළ අවශ්‍යතා සපුරාලන නවීන තාක්ෂණික උපාධිධාරීන් පිරිසක් සපයන විශ්වවිද්‍යාලයක් වන හෙයින්, ශ්‍රී ලංකාවේ වර්ධනය වන ඉදිකිරීම්, කාර්මික, කර්මාන්ත සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රවල මෙන්ම ගෝලීය අවශ්‍යතාවන් ද සලකමින්, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සඳහා ඉංජිනේරු පීඨයක් ස්ථාපනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 103/2025

ගරු රෝහණ බංඩාර මහතා,— පිහිනුම් කුසලතාවය ඉහළ දැමීමේ වැඩසටහනක් සකස් කිරීම,— දියෙහි ගිලී මිය යන පුද්ගලයන්ගේ සංඛ්‍යාව දිනෙන් දින ඉහළ යන බව මෑත කාලීනව නිරීක්ෂණය වන හෙයින්, ඉතා උසස් වාරි ශිෂ්ඨාචාරයකට හිමිකම් කියන අතීත ජනතාව තුළ පැවති පිහිනුම් කුසලතාවය, වත්මන් පරපුර තුළ ද ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.108/2026

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— දියගම වනාන්තරය ආරක්ෂා කිරීම,— දියගම වනාන්තරය කොළඹ තදාසන්නයේ ඉතිරිව ඇති අවසාන නාගරික පහත්බිම් වැසි වනාන්තරවලින් එකක් වන අතර නගරයට ආසන්නතම වැසි වනාන්තර කොටස වන හෙයින් ද; බොල්ගොඩ ගඟ පෝෂණය කරන එහි තෙත්බිම් සහ ඇළ දොළ හරහා ජල ප්‍රවාහය නියාමනය කිරීමෙන් ස්වාභාවික ගංවතුර අවරෝධකයක් ලෙස එය වැදගත් කාර්යභාරයක් ඉටු කරන හෙයින් ද, එමඟින් අවට ප්‍රජාවන් ගංවතුරෙන් ආරක්ෂා කෙරෙන හෙයින් ද; මෙම වනාන්තරය රතු උණහපුළුවා, දම් පැහැ මුහුණැති කොළ වඳුරා සහ හඳුන් දිවියා වැනි වඳවීමේ තර්ජනයට ලක්ව ඇති සත්ත්ව විශේෂ ඇතුළුව ශාක හා සත්ත්ව විශේෂ 220 කට අධික සංඛ්‍යාවකට නිවහන වන හෙයින් ද; ආසන්න වශයෙන් 12.6% ක් ආවේණික ශාක හා 11.58% ක් ආවේණික සත්ත්ව විශේෂ සඳහා රැකවරණය සලසන එකම තීරණාත්මක ජෛව විවිධත්ව කේන්ද්‍රස්ථානයක් වන හෙයින් ද, ඒවායිනුත් බොහොමයක් නාගරික ව්‍යාප්තිය නිසා වැඩි වැඩියෙන් තර්ජනයට ලක්ව ඇති හෙයින් ද; දියගම වනාන්තරය එහි උණහපුළු ගහනය සම්බන්ධයෙන් ජාත්‍යන්තරව පිළිගැනීමට ලක්ව ඇති හෙයින් ද, විදේශීය සංචාරකයින් ආකර්ෂණය කර ගනිමින් තිරසර පාරිසරික සංචාරක ව්‍යාපාරය සඳහා ශක්තිමත් විභවයක් පවතින හෙයින් ද; ජෛව විවිධත්වය, දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සහ ප්‍රජා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා මෙම වනාන්තරයේ ආරක්ෂාව අත්‍යවශ්‍ය වන හෙයින් ද; දියගම වනාන්තරය අහිමි වීම නැවත යථා තත්ත්වයට පත් කළ නොහැකි තත්ත්වයක් වනු ඇති හෙයින් ද, එය අප්‍රමාදව සංරක්ෂණය කිරීම අනාගත පරම්පරාවන් සඳහා අත්‍යවශ්‍ය කටයුත්තක් වන බැවින් සහ ශ්‍රී ලංකාව එකඟ වී ඇති ජාතික හා ජාත්‍යන්තර සංරක්ෂණ එකඟතාවන් සම්පූර්ණ කිරීමක් වන හෙයින් ද; දියගම වනාන්තරය තුළ සිදු කෙරෙන සියලුම එළිපෙහෙළි කිරීම් සහ සංවර්ධන කටයුතු වහාම නතර කිරීමට, වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක පනත (FFPA) යටතේ ආරක්ෂිත ප්‍රදේශයක් ලෙස එය ගැසට් කිරීමට, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ බලසීමාව යටතේ එය තැබීමට සහ අනාගත ආක්‍රමණ සහ තිරසර නොවන සංවර්ධනයට එරෙහිව හැකි තරම් ශක්තිමත් නීතිමය ආරක්ෂාව සහතික කිරීමට කඩිනමින් ක්‍රියා කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 109/2026

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— සත්‍ය සෙවීමේ කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීම,— වසර 26 කට වැඩි කාලයක් පුරා පැවැති උතුරු නැගෙනහිර යුද්ධය නිසා සිදු වූ ජීවිත හානි, අතුරුදහන්වීම් සහ අනෙකුත් විනාශයන් සොයා බැලීම සඳහා ද, ජාතික සමඟිය ඇති කිරීම සහ ඒ වෙනුවෙන් ගත හැකි ඉදිරි පියවර සොයා බැලීම සඳහා ද වන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා සත්‍ය සෙවීමේ කොමිෂන් සභාවක් (Truth Commission) ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 110/2026

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— වයස අවුරුදු 15ට අඩු ළමුන්ට සමාජ මාධ්‍ය භාවිතය සීමා කරන නීතිමය ක්‍රමවේදයක් හඳුන්වාදීම,— අධික සමාජ මාධ්‍ය භාවිතය හේතුවෙන් ළමුන් අතර මානසික පීඩනය සහ ආතතිය වැඩිවීම, අධ්‍යාපන කාර්ය සාධනය පහළ යාම, සයිබර් හිංසන (cyberbullying), අශෝභන හා අනාරක්ෂිත අන්තර්ගතයන්ට නිරාවරණය වීම වැනි ගැටලු වැඩිවෙමින් පවතින හෙයින් ද, ඕස්ට්‍රේලියාව, ප්‍රංශය හා ඩෙන්මාර්ක් වැනි දියුණු රටවල් මේ වනවිටත් ළමුන් සඳහා සමාජ මාධ්‍ය භාවිතය සීමා කිරීමට නීති හඳුන්වා දී තිබෙන හෙයින් ද, ළමුන්ගේ මානසික සෞඛ්‍යය, ආරක්ෂාව සහ අධ්‍යාපනමය වර්ධනය ආරක්ෂා කිරීම වෙනුවෙන් සමාජ මාධ්‍ය ගිණුම් විවෘත කිරීම සඳහා අවම වයස අවුරුදු 15 ලෙස නියම කිරීම, සමාජ මාධ්‍ය සමාගම් සඳහා වයස් සත්‍යාපන ක්‍රම අනිවාර්ය කිරීම, නීතිය උල්ලංඝනය කරන ආයතන සඳහා දඬ සහ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සහ වැඩිහිටියන්ගේ ගිණුම් භාවිතා කරමින් සමාජ මාධ්‍ය භාවිතා කරන දරුවන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීම යන කරුණු ක්‍රියාවට නැංවීම සඳහා වයස අවුරුදු 15ට අඩු ළමුන්ට සමාජ මාධ්‍ය භාවිතය සීමා කරන නීතිමය ක්‍රමවේදයක් හඳුන්වාදීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 112/2026

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඉවත් කිරීම,— ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මඟින් වසර 40 කට වැඩි කාලයක් තිස්සේ දිගු කාලීන අත්තනෝමතික රඳවා තබා ගැනීම්වලට ඉඩ සලසා ඇති හෙයින් ද, වධහිංසා මඟින් ව්‍යාජ පාපොච්ඡාරණ ලබා ගැනීම සඳහා සහ සුළු ජන කොට්ඨාස සහ සිවිල් සමාජ කණ්ඩායම් ඉලක්ක කර ගැනීමට භාවිතා වී ඇති හෙයින් ද, අත්‍යවශ්‍යම මොහොතක දී හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමට හැකියාව පවතින හෙයින් ද, ත්‍රස්තවාදයට සම්බන්ධ වැරදි සඳහා දැනටමත් දණ්ඩ නීති සංග්‍රහය යටතේ නඩු පැවරීමට හැකියාව පවතින හෙයින් ද, පුළුල් බලතල සහිත ස්ථිර ත්‍රස්ත විරෝධී නීතියක් සඳහා කිසිදු සාධාරණීකරණයක් නොමැති බැවින් ද, ශ්‍රී ලංකා රජය විසින් 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, එම පනතට සමාන නීතිමය විධිවිධාන අඩංගු නීතියක් හඳුන්වා දීමකින් තොරව, සම්පූර්ණයෙන්ම ඉවත් කිරීම සඳහා වහාම පියවර ගත යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 114/2026

ගරු රවී කරුණානායක මහතා, — ලෝක පරිසරය සුරැකීම, — ලෝක පරිසරය සුරැකීම කෙරෙහි ශ්‍රී ලංකාව වඩා වැඩි අවධානයක් යොමු කළ යුතු බවත්, විශේෂයෙන්ම ගෝලීය උණුසුම ඉහළ යාම වැළැක්වීම සඳහා පියවර ගත යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 115/2026

ගරු රවී කරුණානායක මහතා,— මූල්‍ය වංචාවන්ට හසු වූ තැන්පත්කරුවන්ගේ මුදල් ආපසු ගෙවීම,— ලියාපදිංචි මූල්‍ය සමාගම් තුළ මුදල් තැන්පත් කර මූල්‍ය වංචාවන්ට හසු වූ තැන්පත්කරුවන්ට එම මුදල් නැවත ගෙවීම සඳහා රජය විසින් පියවර ගනු ලැබිය යුතු බවත්, එකී සමාගම් තුළ මුදල් තැන්පත් කර වංචාවන්ට හසු වූ තැන්පත්කරුවන් විශාල සංඛ්‍යාවක් සිටින බැවින්, එකී සමාගම්වල භාරකාර ආයතනය වන ශ්‍රී ලංකා මහ බැංකුව මෙහිදී කාර්යක්ෂමව ක්‍රියා කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 116/2026

ගරු චමින්ද විජේසිරි මහතා,— රජයේ රෝහල් පද්ධතිය තුළ බාහිර රෝගී අංශවල පවතින තදබදය අවම කිරීමට වැඩසටහනක් සකස් කිරීම,— ලෝක සෞඛ්‍ය දර්ශකයේ අප රටෙහි ස්ථානය කුමක් වුව ද, රජයේ රෝහල්වල බාහිර රෝගී ප්‍රතිකාර ඒකකයන් හි පවතින දැඩි තදබදය පාලනය කිරීම සඳහා වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 117/2026

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අලි-මිනිස් ගැටුම බහුලව පවතින ප්‍රදේශවල මී මැසි පාලනය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් සකස් කිරීම,— සංඛ්‍යා දත්ත වාර්තාවලට අනුව අලි-මිනිස් ගැටුම ඉහළින්ම පවතින රටක් ලෙස ශ්‍රී ලංකාව මේ වනවිට පත්ව ඇති හෙයින් ද, ඒ හේතුවෙන් වාර්ෂිකව මිනිසුන් හා අලි ඇතුන් විශාල සංඛ්‍යාවකගේ ජීවිත අහිමි වන හෙයින් ද, දේපළ ඇතුළු භෞතික සම්පත් විනාශ වන හෙයින් ද, එම තත්ත්වය වැළැක්වීමේ නියමු ව්‍යාපෘතියක් ලෙස කෙන්යාව වැනි රටවල ක්‍රියාත්මක වන පරිදි, අලි-මිනිස් ගැටුම සිදුවන ප්‍රදේශවල මී මැසි පාලනය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 119/2026

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— උතුරු පළාතේ සෙසු දිස්ත්‍රික්කවල සේවය කරන යාපනය දිස්ත්‍රික්කයට අයත් ගුරුවරුන් සහ රාජ්‍ය නිලධාරින්ගේ යහපත පිණිස විධිමත් නවාතැන් පහසුකම් හෝ මහල් නිවාස ව්‍යාපෘති ඇති කිරීම,— යාපනය දිස්ත්‍රික්කයේ සිට කිලිනොච්චිය, මුලතිව්, මන්නාරම සහ වවුනියාව යන දිස්ත්‍රික්කවලට අනුයුක්තව බොහෝ දුෂ්කරතා මධ්‍යයේ සේවය කරන රාජ්‍ය නිලධාරින්ගේ සහ ගුරුවරුන්ගේ ප්‍රවාහන අපහසුතා සහ නවාතැන් ගැටලුවලට ස්ථිර විසඳුමක් ලබාදීම සහ ඔවුන්ගේ සේවය කාර්යක්ෂමව ලබා ගැනීම සහතික කිරීම සඳහා, ඒ ඒ දිස්ත්‍රික්කයන්හි කේන්ද්‍රීය ප්‍රදේශයක හෝ උචිත ස්ථානයක සියලු පහසුකම්වලින් සමන්විත විධිමත් නවාතැන් පහසුකම් හෝ මහල් නිවාස ව්‍යාපෘති රජය විසින් ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 120/2026

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— ශ්‍රී ලංකාවේ සාගර සම්පත් කාර්යක්ෂමව පරිහරණය කිරීමට සහ මුහුදු ආශ්‍රිත කර්මාන්ත වැඩි දියුණු කිරීමට මුලතිව් දිස්ත්‍රික්කය තුළ සාගර විශ්වවිද්‍යාලයක් (Ocean University) ස්ථාපනය කිරීම,— ශ්‍රී ලංකාව වටා ඇති ගැඹුරු මුහුදු සහ වෙරළාසන්න සාගර සම්පත් විද්‍යාත්මකව හා තාක්ෂණිකව මෙහෙයවීමට අවශ්‍ය මානව සම්පත නිර්මාණය කිරීම මඟින් රටේ ආර්ථිකය ශක්තිමත් කළ හැකි හෙයින්, උතුරු පළාතේ ඉහළ සාගර විභවතාවක් සහිත මුලතිව් දිස්ත්‍රික්කයේ ධීවර ප්‍රජාවගේ ජීවනෝපාය නවීකරණය

කිරීමටත්, තරුණ තරුණියන්ට සාගර ඉංජිනේරු විද්‍යාව, සාගර ගවේෂණය සහ ජලජ සම්පත් කළමනාකරණය වැනි ක්ෂේත්‍රයන්හි උසස් අධ්‍යාපන අවස්ථා ලබා දීමටත්, සියලු පහසුකම්වලින් සමන්විත සාගර විශ්වවිද්‍යාලයක් මුලතිව් දිස්ත්‍රික්කය තුළ ස්ථාපනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 121/2026

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— යාපනය දිස්ත්‍රික්කයේ දූපත් ආශ්‍රිත ප්‍රදේශවල සහ වෙරළාසන්න ගම්මානවල පවතින දැඩි පානීය ජල හිඟයට ස්ථිර විසඳුමක් ලෙස මුහුදු ජලය පිරිපහදු කිරීමේ ව්‍යාපෘති (Desalination Plants) පුළුල් කිරීම,— යාපනය දිස්ත්‍රික්කයේ බොහෝ ප්‍රදේශවල භූගත ජලය, කිවුල් ජලය බවට පරිවර්තනය වෙමින් පවතින හෙයින් ද, විශේෂයෙන්ම වේලනෙයි සහ නාගදීපය වැනි දූපත් ප්‍රදේශවල ජනතාව පානීය ජලය ලබා ගැනීමේ දී දැඩි දුෂ්කරතාවලට මුහුණ දෙන හෙයින් ද, නාගදීපය වැනි ප්‍රදේශවල දැනටමත් පවතින ජල පිරිපහදු මධ්‍යස්ථානවල ධාරිතාව ඉහළ නැංවීමත්, කුරිකට්ටුවාන් හරහා නළ මාර්ගයෙන් ජලය සැපයීමේ ව්‍යාපෘතිය කඩිනම් කිරීමත් මඟින් ජනතාවගේ මූලික අවශ්‍යතාවයක් වන පිරිසිදු පානීය ජලය මෙම ප්‍රදේශවල ජනතාවට ද ලබා දීම සහතික කිරීම සඳහා මුහුදු ජලය පිරිපහදු කිරීමේ ව්‍යාපෘති පුළුල් කිරීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා රජය ප්‍රමුඛතාවය ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 122/2026

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— උතුරු පළාතේ තරුණයින් අතර ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන මත් ද්‍රව්‍ය භාවිතය පාලනය කිරීම සඳහා විශේෂ කාර්ය සාධක බලකායක් පිහිටුවීම සහ නවීන පුනරුත්ථාපන මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම,— උතුරු පළාතේ මෑතක සිට ඉහළ ගොස් ඇති මත්ද්‍රව්‍ය ජාවාරම හා මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් සමාජ පද්ධතිය බිඳවැටීම සහ පාසල් සිසුන්ගේ අනාගතයට බලපෑම් එල්ල වන හෙයින්, මත්ද්‍රව්‍ය බෙදාහැරීමේ ජාලය මැඩලීම සඳහා ආරක්ෂක අංශ සම්බන්ධීකරණය කර ගනිමින් විශේෂ වැටලීම් වැඩි කිරීම සඳහා විශේෂ කාර්ය සාධක බලකායක් පිහිටුවීමටත්, මත්ද්‍රව්‍යවලට ගොදුරු වූ තරුණයින් යහමඟට ගැනීම සඳහා උතුරු පළාත තුළ සියලු පහසුකම් සහිත රජයේ පුනරුත්ථාපන සහ උපදේශන මධ්‍යස්ථාන ස්ථාපනය කිරීමටත් රජය විසින් පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 123/2026

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— උතුරු පළාතේ තල් සහ පොල් මූලික කරගත් අපනයන කර්මාන්තශාලා ස්ථාපනය කර රැකියා විරහිත උපාධිධාරීන් සඳහා රැකියා අවස්ථා නිර්මාණය කිරීම,— උතුරු පළාතේ බහුලව පවතින තල් සහ පොල් හුදෙක් අමුද්‍රව්‍ය ලෙස පමණක් භාවිතා නොකර, නවීන තාක්ෂණය භාවිතයෙන් අගය එකතු කළ නිෂ්පාදන නිපදවන අපනයන කර්මාන්තශාලා රාජ්‍ය හා පෞද්ගලික අංශවල සහභාගිත්වයෙන් දිස්ත්‍රික් මට්ටමින් පිහිටුවීමටත්, එමඟින් එම ප්‍රදේශවල රැකියා විරහිත තරුණ තරුණියන්ගේ සහ උපාධිධාරීන්ගේ ජීවනෝපාය මාර්ග සුරක්ෂිත කිරීමටත් රජය සැලසුම් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 124/2026

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— උතුරු පළාතේ ආරක්ෂක හමුදා භාරයේ ඇති මහජනතාවගේ ඉඩම් නිදහස් කිරීම සහ කෘෂිකාර්මික හා ධීවර කටයුතු සඳහා එම ඉඩම් පරිහරණය කිරීමට අවසර ලබාදීම,— යුද්ධයෙන් පසුව සිදුකෙරුණු නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියේ දී, මහජනතාවගේ ඉඩම් මෙතෙක් මුළුමනින්ම නිදහස් කර නොමැති හෙයින් ද, ඒ හේතුවෙන් ඔවුන්ගේ සාම්ප්‍රදායික කෘෂිකාර්මික කටයුතුවල සහ ධීවර කර්මාන්තයේ නිරතවීමේ අවස්ථා අහිමි වී ඇති හෙයින් ද, මෙතෙක් නිදහස් කර නොමැති මහජනතාවගේ ඉතිරි ඉඩම්, ජාතික ආරක්ෂාවට තර්ජනයක් නොවන පරිදි කඩිනමින් නිදහස් කිරීමටත්, මහජනතාවගේ ජීවනෝපාය මාර්ග යළි නගාසිටුවීම සඳහා කෘෂිකාර්මික හා ධීවර කටයුතු වෙනුවෙන් එම ඉඩම් පරිහරණය කිරීමට අවසර ලබාදීමටත් රජය විසින් පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 128/2026

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— උතුරු පළාතේ වන්නි සහ යාපනය දුපත් ප්‍රදේශයන්හි පාසල්වල පවතින ගුරු හිඟය සහ ඩිජිටල් අධ්‍යාපන ගැටලු සඳහා විසඳුම් ලබා දීම,— වන්නි සහ යාපනය දුපත් ප්‍රදේශයන්හි පාසල්වල පවතින ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි විෂයයන් සඳහා වූ ගුරු පුරප්පාඩු දිස්ත්‍රික් මට්ටමේ පත්වීම් තුළින් පිරවීමටත්, එම ප්‍රදේශවල සිසුන්ගේ තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය වර්ධනය කිරීම සඳහා නවීන පරිගණක විද්‍යාගාර සහ විධිමත් අන්තර්ජාල පහසුකම් ලබා දීමටත් සහ දරිද්‍රතා රේඛාවට පහළින් සිටින පවුල්වල සිසුන්හට අමතර අධ්‍යාපන අවස්ථා ලබාදීම සඳහා විශේෂ ශිෂ්‍යත්ව යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමටත් පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 129/2026

ගරු ටී.කේ. ජයසුන්දර මහතා,— ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම,— උණ, වේවැල්, පන් හා කිතුල් ආදී ශාකවල කඳන්, ව්‍යාජ කඳන් හා පත්‍ර ප්‍රයෝජනයට ගනිමින් සිදුකරනු ලබන සාම්ප්‍රදායික කර්මාන්ත මඟින්, ශ්‍රී ලංකාවේ කර්මාන්ත හා සංචාරක ක්ෂේත්‍රයන් සඳහා විශේෂ දායකත්වයක් ලබා දිය හැකි හෙයින්, ශ්‍රී ලංකාවේ කර්මාන්ත ක්ෂේත්‍රයේ හා සංචාරක ක්ෂේත්‍රයේ වර්තමාන පිබිදීමට සමගාමීව එකී සාම්ප්‍රදායික කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණය ලබා දීමටත්, එම නිෂ්පාදන සඳහා වන වෙළඳපොළ වර්ධනය කිරීමටත්, ඒ සඳහා නිල පිළිගැනීමක් ලබා දීමටත්, මහා පරිමාණ කර්මාන්ත ඇති කිරීම සඳහා එම වගාවන් ප්‍රවර්ධනය කිරීමටත්, ඒ සඳහා ව්‍යවසායකයන් දිරිමත් කිරීමටත්, එම ශිල්පීන්ගේ ශ්‍රමයට හා කුසලතාවන්ට ඉහල වටිනාකමක් ලබා දීමටත් සහ ඔවුන්ගේ විශ්‍රාම දිවිය සුරක්ෂිත කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීමටත් අවශ්‍ය මෙහෙයුම් යාන්ත්‍රණයක් සකස් කිරීම සඳහා පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 130/2026

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා,— පුත්තලම දුම්රිය මාර්ගයේ දුම්රිය ධාවනය ඉහළ නැංවීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— මැදපෙරදිග කලාපයේ මේ වනවිට උද්ගත වී ඇති වාතාවරණය මත ඉන්ධන මිල ඉහළ යෑමේ තත්ත්වය හමුවේ මහජනයා විශාල වශයෙන් පොදු ප්‍රවාහන සේවා වෙත නැඹුරු වීමේ ප්‍රවණතාවක් ඇති වී තිබෙන හෙයින් ද,

දිනපතා විශාල පිරිසක් රාජකාරි හෝ ව්‍යාපාරික අවශ්‍යතාවයන් සඳහා පුත්තලම මාර්ගයේ ගමන් ගන්නා හෙයින් ද, එම මගී ජනතාවට ප්‍රමාණවත් සේවාවක් ලබා දීම සඳහා පුත්තලම -කොළඹ අතර දුම්රිය ධාවනය ඉහළ දැමීමට වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 131/2026

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— පොදු ස්ථාන සහ රාජ්‍ය ආයතනවල සූර්ය බලයෙන් ක්‍රියා කරන ආරෝපණ ඒකක සවිකිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම,— විදුලියෙන් පමණක් ක්‍රියා කරන යතුරු පැදි සහ වාහන භාවිතය මේ වනවිට ජනතාව අතර ප්‍රචලිතව ඇති හෙයින් ද, එය පරිසර දූෂණය අවම කිරීමට ඉතාමත් වැදගත් පියවරක් වන හෙයින් ද, එය වර්තමානයේ පවත්නා අධික ඉන්ධන පරිභෝජනයට විසඳුමක් මෙන්ම ඉන්ධන සඳහා වැය වන අධික පිරිවැයට සාධාරණ විසඳුමක් වන හෙයින් ද, විදුලි යතුරු පැදි සහ වාහන භාවිතය හේතුවෙන් විදුලි පරිභෝජනය ඉහළ යා හැකි හෙයින් ද, යම් විදුලි කප්පාදුවක් ඇති වුවහොත් ඒවා භාවිතා කරන ජනතාව උග්‍ර පීඩාවකට ලක්වීමේ වැඩි ප්‍රවණතාවක් ඇති හෙයින් ද, විදුලි යතුරු පැදි සහ වාහන භාවිතා කරන ජනතාවට සහනයක් ලබා දීමට මෙන්ම විදුලි යතුරු පැදි සහ වාහන මඟින් දුර ගමන් යන ජනතාවගේ යතුරු පැදි සහ වාහනවල බැටරිය ආරෝපණය කර ගැනීමේ පහසුව සඳහා පොදු ස්ථානවල සහ රාජ්‍ය ආයතන පරිශ්‍රවල සූර්ය බලයෙන් ක්‍රියා කරන ආරෝපණ ඒකක (Solar Charging Points) සවිකිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 132/2026

ගරු අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා,— 1983 'කළු ජූලිය' සමඟ ඇති වූ ජනවාර්ගික ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ සත්‍යය සෙවීම, විනාශයන් තක්සේරු කිරීම සහ නැවත එවැනි ජනවාර්ගික ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවීම වැළැක්වීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවක් පත් කිරීම,— 1983 'කළු ජූලිය' සහ වැලිකඩ බන්ධනාගාරයේ සිදු වූ සමූල ඝාතන, ජනවාර්ගික ගැටුම් සහ ප්‍රචණ්ඩ ක්‍රියාවන්, රටේ ජාතික ඒකාබද්ධතාව, සමාජ ව්‍යුහය සහ ආර්ථිකය මත දරුණු කැළලක් ඇති කර ඇති හෙයින් ද, මෙම ගැටුම් සහ ප්‍රචණ්ඩ ක්‍රියාවලදී දහස් සංඛ්‍යාත ජනතාවක් ඝාතනයට ලක්ව, දස දහස් සංඛ්‍යාත පිරිසක් අවතැන් වී සරණාගතයන් බවට පත් කළ හෙයින් ද, නිවාස සහ ව්‍යාපාරික ස්ථාන ඇතුළු වටිනා දේපළ ගිනි තබා සම්පූර්ණයෙන්ම විනාශ කරන ලද හෙයින් ද, මෙම සිදුවීම සිදුවී වසර හතළිහකට වඩා වැඩි කාලයක් ගතවී ඇතත්, මෙම ගැටුම් සහ ප්‍රචණ්ඩ ක්‍රියා මෙහෙය වූ තැනැත්තන් හඳුනාගෙන නොමැති හෙයින් ද, සිදු වූ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සහ දේපළ හානි පිළිබඳව පුළුල් හා ස්වාධීන විමර්ශනයක් මෙතෙක් පවත්වා නොමැති හෙයින් ද, මෙවැනි ජනවාර්ගික ගැටුම් සහ ප්‍රචණ්ඩ ක්‍රියා නැවත අප රට තුළ සිදු නොවීම තහවුරු කිරීම සහ රටේ සියලුම ජන කොටස් අතර තිරසර සමගිය හා සංහිඳියාව ගොඩනැඟීම අත්‍යවශ්‍ය වන හෙයින් ද, එකී ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ සත්‍යය සෙවීම, විනාශයන් තක්සේරු කිරීම සහ නැවත එවැනි ජනවාර්ගික ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවීම වැළැක්වීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 133/2026

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා,— මාර්ග රක්ෂිතයන්හි ගස් සිටුවීම, විද්‍යාත්මකව කළමනාකරණය කිරීම සහ නඩත්තු කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම,— පදිකයන්ට සෙවණ සැපයීම, පරිසරයේ සුන්දරත්වය සහ හරිත ආවරණය වැඩිදියුණු කිරීම, වාහනවලින් නිකුත් වන දූෂක වායු අවශෝෂණය කිරීම මෙන්ම නාගරික ප්‍රදේශවල ජෛව කොරිඩෝ (biological corridors) ලෙස ක්‍රියා කිරීම උදෙසා මාර්ග රක්ෂිතයන්හි ඇති ගස් මඟින් සුවිශාල මෙහෙවරක් ඉටු කෙරෙන හෙයින් ද, ශ්‍රී ලංකාවේ මාර්ග රක්ෂිතයන්හි ගස් වෘත්තීයමය ආකාරයෙන් (arborists මඟින්) කළමනාකරණය නොකෙරෙන හෙයින් ද, විදුලිබලය සපයන ආයතන, මාර්ග සංවර්ධන අධිකාරිය (RDA), පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය (PRDA), පළාත් පාලන ආයතන සහ ශ්‍රී ලංකා ටෙලිකොම් වැනි ආයතනවල සේවකයන් මඟින් විදුලි රැහැන් හා මාර්ග සංඥා ආවරණය වන අතු පමණක් කපා ඉවත් කිරීමේ අක්‍රමවත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක වන හෙයින් ද, පරිසර සුන්දරත්වය රැකෙන පරිදි මාර්ග රක්ෂිත ප්‍රමාණයන් නිසි ලෙස නිර්ණය කිරීම, අදාළ ආයතනවල සේවකයන් පුහුණු කරමින් ශාක වියන් නඩත්තු කිරීම සහ මාර්ග රක්ෂිතවල ගස් නිසි ලෙස කළමනාකරණය කිරීම තුළින් සිදුවන අනතුරු හා ව්‍යසන වළක්වා ගත හැකි විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 134/2026

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— 1988/90 කාලසීමාවේ සිදු වූ සිවිල් යුධමය තත්ත්වය සහ එවැනි තත්ත්වයක් නැවත ඇති වීම වැළැක්වීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීම,— 1988/90 කාලසීමාවේ ශ්‍රී ලංකාවේ සිදු වූ ජනතා විමුක්ති පෙරමුණ මූලික කරගත් සිවිල් යුධමය තත්ත්වය තුළ ඇති වූ විනාශයේ, ආර්ථිකමය වටිනාකම සහ සත්‍ය වශයෙන්ම එම තත්ත්වයට හේතු වූ සිදුවීම පිටුපස තිබූ තරුණ නැගිටීම, එහි දේශපාලන මතවාදයන් මෙන්ම, එවැනි තත්ත්වයක් නැවත ඇති නොවීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව මනා අධ්‍යයනක් සිදු කිරීම සඳහා කොමිෂන් සභාවක් ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.